කාර්යසාධන වාර්තාව

2022

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ජය මාවත, කටුබැද්ද, මොරටුව.

දුරකථන අංකය : **011-2044860**

ෆැක්ස් අංකය : **011-2044879**

වෙබ් අඩවිය : **http://www.csd.lk**

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වත්මන් ප්‍රගතිය පිළිබඳව සනිටුහන් වන 2022 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට මෙම පණිවුඩය නිකුත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම අතිශයින් සතුටු වෙමි.

මෙම දෙපාර්තමේන්තුව වර්තමානයේ බලකා 24 කින් පුහුණු පාසල් 04 කින් සහ විශේෂ ව්‍යාපෘති 03කින් මුළු ශ්‍රී ලංකාද්වීපය පුරා පැතිරයමින් 34,500කට ආසන්න හට සංඛ්‍යාවකින් සමන්විත ශ්‍රී ලංකාවේ ඇති එකම පරිපූරක හමුදාව වශයෙන් නිස්වසරක කුරිරු යුද්ධයේ පශ්චාත් අවධිය තුළ රට නැවත ගොඩනැගීමේ මහඟු ක්‍රියාවලියට තම දායකත්වය ලබාදෙමින් සිටියි. ශ්‍රී ලංකාව පුරා ඉතාමත් ශක්තිමත්ව විහිදුනු මෙම දෙපාර්තමේන්තුව තම ප්‍රධාන රාජකාරීන්ට අමතරව වී වගාවට මුල්තැන දෙමින් කෘෂිකාර්මික ව්‍යාපෘතීන් සිදු කරන අතර ශ්‍රී ලංකාව තුළ හරිත කෘෂිකර්මාන්තය නගාසිටුවීමේ පුරෝගාමී කාර්යය ඉටුකරමින් ගුණාත්මක තත්ත්වයේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා දායක වී ඇත. එයින් නොනැවතී ශ්‍රී ලංකා කජු නිෂ්පාදනයේ පුළුල් මෙහෙයක් ඉටුකරමින් අපනයන බෝග ශ්‍රී ලංකාව තුළ වර්ධනය කිරීමට ද වර්තමානයේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් ක්‍රියා කරමින් සිටිති. තවද අලි මිනිස් ගැටුම අවම කිරීම උදෙසා වනජීවී දෙපාර්තමේන්තුව හා සම්බන්ධතාවයෙන් කටයුතු කරනු ලබන අතර, එහිදී දිවයින පුරා ස්ථාපිත විදුලි වැටවල් 318ක (කි.මී 4638) නඩත්තු කටයුතු සඳහාත්, වන අලි පලවා හැරීමේ රාජකාරී සඳහාත්, වනජීවී කාර්යාල වෙතත් සිවිල් ආරක්ෂක සාමාජිකයින් 4550 දෙනෙකු යොදවා ඇත.

කුරගල, දීඝවාපිය, නීලගිරිය ආදී පුරාණ බෞද්ධ සිද්ධස්ථාන නැවත වරක් ලෝකවාසී බෞද්ධ බැතිමතුන්ට වන්දනාමාන කිරීම උදෙසා එවන් බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය මෙන්ම දිවයින පුරා විසිරුණු බෞද්ධ සිද්ධස්ථාන නඟා සිටුවීමේ කාර්යට සක්‍රීයව යෙදී සිටින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයෝ විවිධ බාහිර පාර්ශවවලින් එල්ලවන බලපෑම්වලින් බෞද්ධ මධ්‍යස්ථාන මෙන්ම පුරාවිද්‍යා වටිනාකමක් ඇති ස්ථාන ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ද තම දායකත්වය ලබාදෙමින් සිටිති. විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම පරිදි එම ආයතනවල ආරක්ෂක රාජකාරීන් ද ශ්‍රී ලංකා පොලිසිය සමඟ එක්ව නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියේ සක්‍රීය කොටස්කරුවන් වෙමින් ද රටට අත්‍යාවශ්‍ය වූ ඉදිකිරීම් ඉතාමත් කාර්යක්ෂම මෙන්ම ඉහළ ගුණාත්මක භාවයකින් යුක්තව සාපේක්ෂව අඩුපිරිවැයකින් ඉටු කිරීමේ කාර්යයට ද වර්තමානයේ මෙම දෙපාර්තමේන්තු සාමාජිකයෝ යෙදී සිටිති.

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ උපදෙස් මත ගරු ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මැතිතුමාගේ මාර්ගෝපදේශයෙන් රටේ කෘෂි කර්මාන්තය මෙන්ම අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා මෙම දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන්ගේ සේවය ලබාදෙන අතර, පසුගිය වසර තුළ දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් ඉලක්ක හා අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට හැකියාව ලැබී ඇත. එහිදී මෙම දෙපාර්තමේන්තුව වෙතින් ඇස්තමේන්තු ගත කළ ආදායම රුපියල් මිලියන 925 වුවද, රුපියල් මිලියන 1939.1ක සම්පූර්ණ ආදායමක් උපයා ගැනීමටත්, ඉන් රජයේ ආදායමට රුපියල් මිලියන 1565 ක මුදලක් බැරකිරීමටත් හැකි වී ඇති අතර, රුපියල් මිලියන 374.1 ක හිඟ ආදායමක් පවතින බැව් වාර්තා අනුව පෙන්වා දිය හැක.

මෙවන් විශාල සේවයක් රට වෙනුවෙන් සපයන්නා වූ සිවිල් ආරක්ෂක සාමාජික/ සාමාජිකාවන්ගේ වෘත්තිය දැනුම නංවාලීම සඳහා සුවිශේෂී ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ක්‍රියාවට නංවා ඇති අතර, තව ද ඔවුන්ගේ ආකල්ප, කුසලතා මෙන්ම ඔවුන්ගේ සේවා තෘප්තිය ඉහළ නැංවීම උදෙසා විශේෂ ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ආරම්භ කර ඇත. ඒ අතර දිස්ත්‍රික් නිලධාරී පුහුණු පාඨමාලා, ජ්‍යෙෂ්ඨ නියාමක/නියාමකවරියන් සඳහා නායකත්ව පුහුණු පාඨමාලා හා වෘත්තීය පුහුණු පාඨමාලා ආරම්භ කරමින් ඔවුන්ගේ රාජකාරී කටයුතු මනාව ඉටුකිරීමට අවශ්‍ය දැනුම ලබාදීම මඟින් ඔවුන්ගේ දායකත්වය තවදුරටත් ඉහළ එලදායීතාවයකින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

පසුගිය වසරවල මෙන්ම 2022 වර්ෂයේත් නිවාස නොමැති සාමාජිකයින් හට නිවාස ලබාදීම ද, නිවාසවල වැඩ අවසන් කිරීමට නොහැකිවූවන් හට ඒවායේ වැඩ අවසන් කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ද තම දුවා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පොත්පත් හා ලැප්ටොප් පරිගණක ආදිය නොමිලේ ලබාදීම ද මේ වන විට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සිදුකරමින් පවතී. එමඟින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජිකයින්ගේ සාමාජයීය තත්ත්වය ඉහළ නැංවීම මූලික පරමාර්ථය වී ඇත.

එසේම දිවයින පුරා ග්‍රාමීය මට්ටමින් ඩෙංගු උවදුර මැඩපැවැත්වීම උදෙසා ශ්‍රමදාන කාර්යයන් හා ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ සම්බන්ධතාවයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකිරීමත්, මතින් තොර දේශයක් බිහිකරලීමේ කාර්යය වෙනුවෙන් පුහුණුවලත් උපදේශකයින් මඟින් මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමත්, ලේ දන් දීමේ වැඩසටහන් සඳහා දායකත්ව සැපයීමත්, ජීවිතාරක්ෂක කණ්ඩායම් මඟින් දෙස් විදෙස් ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමේ කාර්යයන් ඉටුකිරීමත් වැනි සමාජ සුබ සාධන කාර්යයන්හී නිරත වීම හා ඒ පිළිබඳ දෙපාර්තමේන්තු සාමාජිකයින් ඇගයීමට ලක්වීම ඉතා ප්‍රශංසනීය වනු ඇත.

මාතෘ භූමියේ නිරසර සංවර්ධනය නංවාලීම සඳහා මෙන්ම නීතිය හා සාමය පවත්වාගෙන යාම උදෙසා අවශ්‍ය සහය උපරිම ලෙස ලබා දීමටත්, මෙම වසරේදී **"සියවසට පියවරක්"** යන තේමාව යටතේ 2023 - 2048 ඉදිරි විසිපස් වසර සඳහා වන ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රවේශයට අනුගත වෙමින් අප වෙත පැවරෙන සියළුම වගකීම් කැපවීමෙන් මෙන්ම හැකි උපරිම අයුරින් ඉටු කිරීමටත් ශ්‍රී ලංකාද්වීපය ගොඩනැංවීමේ කාර්යය උදෙසා ලබාදිය හැකි උපරිම දායකත්වය ලබා දීමට අපේක්ෂා කරන අතරම එම කාර්යයන් උසස් එලදායීතාවයකින් ලබාදීම උදෙසා නිලධාරීන් ඇතුළු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සාමාජික/සාමාජිකාවන් හටත්, සිවිල් කාර්යය මණ්ඩලයටත් අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා'යි ඉතසිනින් ප්‍රාර්ථනා කරමි.

මේජර් ජෙනරාල් එන්ආර් ලමාහේවාගේ (විශ්‍රා)
ආර්ඛබ්පී ආර්එස්පී එන්ඩීයූ
අධ්‍යක්ෂ ජනරාල්

දෙපාර්තමේන්තු පරිපාලන කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	මේජර් ජෙනරාල්	එන්ආර් ලමාහේවාගේ (විශ්‍රා) ආර්ඩබ්පී ආර්එස්පී එන්ඩීයූ	අධ්‍යක්ෂ ජනරාල්
2	බ්‍රිගේඩියර්	වී වීරක්කොඩි (විශ්‍රා) එම්අයිඑම්	අධ්‍යක්ෂ පාලන / පර්යේෂණ හා සැලසුම්
3	බ්‍රිගේඩියර්	ඩීඒකේ දිසානායක (විශ්‍රා) ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී	අධ්‍යක්ෂ ව්‍යාපෘති හා මාධ්‍යය
4	බ්‍රිගේඩියර්	අයිඩීඩී ප්‍රනාන්දු	අධ්‍යක්ෂ පිරිස් පාලන
5	කර්නල්	එම්ඒඑච්ඩබ් ප්‍රේමචන්ද්‍ර ආර්එස්පී	අණදෙන නිලධාරී - අනුරාධපුර
6	කර්නල්	ඩීඅයිඒ පෙරේරා ආර්එස්පී යූඑස්පී	අධ්‍යක්ෂ මෙහෙයුම්
7	කර්නල්	බීඒකේඑස්ඒ බස්නායක	අණදෙන නිලධාරී - හොරොව්පොතාන
8	කර්නල්	එල්ජීකේ කිත්සිරි	අණදෙන නිලධාරී - කතරගම
9	ලුතිනන් කර්නල්	ආර්එම්සීඑල්කේකේ රත්නායක	අධ්‍යක්ෂ පුහුණු
10	ලුතිනන් කර්නල්	එච්ආර්ඩබ් ද සිල්වා	අණදෙන නිලධාරී - උහන
11	ලුතිනන් කර්නල්	කේඑන් සිල්වා	වනජීවී සම්බන්ධීකරණ නිලධාරී
12	ලුතිනන් කර්නල්	ඩීජේඑස් පොන්වීර	අණදෙන නිලධාරී - පොලොන්නරුව
13	ලුතිනන් කර්නල්	ඩීඑම්එම් සුභසිංහ	නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම්
14	ලුතිනන් කර්නල්	බීඒයූ වික්‍රමනායක ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ	අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
15	ලුතිනන් කර්නල්	යූජීඒකේඑන්අයි උඩදිවෙල ආර්ඩබ්පී ආර්එස්පී	අණදෙන නිලධාරී - මොණරාගල
16	ලුතිනන් කර්නල්	ආර්එම්බී රත්නායක	අණදෙන නිලධාරී - මූලස්ථානය
17	ලුතිනන් කර්නල්	යූඑච්ටීඑන් පෙරේරා	අණදෙන නිලධාරී - අම්පාර
18	ලුතිනන් කර්නල්	ඩීඑම්එස්සී දසනායක යූඑස්පී	නියෝජ්‍ය අධ්‍යක්ෂ පිරිස් පාලන
19	ලුතිනන් කර්නල්	එම්එම්ජී විජේතුංග යූඑස්පී	අණදෙන නිලධාරී - වැලිඔය
20	ලුතිනන් කර්නල්	යූජීඒකේඑස්සී සෝමපාල යූඑස්පී අයිඑස්සී	අණදෙන නිලධාරී - විශ්වමඩු
21	ලුතිනන් කර්නල්	ඩීඑම්එල්ටී දිසානායක යූඑස්පී පීඑස්සී අයිජී	අණදෙන නිලධාරී - මුලතිව්
22	ලුතිනන් කර්නල්	එච්බීඑම්බීඑන් බණ්ඩාර ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරී - කිලිනොච්චි
23	ලුතිනන් කර්නල්	ජීආර්යූබී අබේරත්න	අණදෙන නිලධාරී - සේරුවිල
24	ලුතිනන් කර්නල්	ආර්එම්සී කමලසිරි යූඑස්පී	අණදෙන නිලධාරී - වෙන්නවත්ත
25	ලුතිනන් කර්නල්	ඒඅයි හෙට්ටිආරච්චි	අණදෙන නිලධාරී - ගෝමරන්කඩවල
26	ලුතිනන් කර්නල්	බීඑච්ඩී පද්මකුමාර	අණදෙන නිලධාරී - පහළලන්ද පුහුණු පාසල
27	ලුතිනන් කර්නල්	යූඑල්සී ජයසේන	අණදෙන නිලධාරී - කල්පිටිය පුහුණු පාසල
28	ලුතිනන් කර්නල්	ඩීඑස්පී විජේසිංහ	අධ්‍යක්ෂ ප්‍රවාහන
29	ලුතිනන් කර්නල්	එස්එම්ඒඩීඑස්ඩබ් ජයසේකර	අණදෙන නිලධාරී - සේරුපිට
30	ලුතිනන් කර්නල්	ඩබ්ඒඒපී ගුණතිලක ආර්එස්පී පීඑස්සී එප්එස්සී අයිජී	අණදෙන නිලධාරී - මහඔය
31	ලුතිනන් කර්නල්	ජීආර්එච් වර්ණජිත් ආර්එස්පී යූඑස්පී	අණදෙන නිලධාරී - වව්නියාව
32	ලුතිනන් කර්නල්	ඩීඑම්එස්ඩීකේ හේරත්	අණදෙන නිලධාරී - මහනුවර

33	ලුතිනන් කර්නල්	එස්ඒකේඩී ලේකම්ආරච්චි ආර්එස්පී	අණදෙන නිලධාරී - පුත්තලම
34	ලුතිනන් කර්නල්	ඒඑස් කුමාර	නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රවාහන
35	ලුතිනන් කර්නල්	ඊආර්ටීඒ සමරකෝන්	නියෝජ්‍ය අධ්‍යක්ෂ ව්‍යාපෘති
36	ලුතිනන් කර්නල්	ඩීආර් තාරුකරත්න	අණදෙන නිලධාරී - ගල්කිරියාගම
37	ලුතිනන් කර්නල්	එන්බියුකේ නිශ්ශංක ආර්එස්පී	අණදෙන නිලධාරී - ත්‍රිකුණාමලය
38	ලුතිනන් කර්නල්	එස්වයි ශ්‍රීමාල්	අධ්‍යක්ෂ සුභසාධන
39	ලුතිනන් කර්නල්	ඩිඑල්වයිඒ ලක්පුර	අණදෙන නිලධාරී - විල්පත්තුව
40	ලුතිනන් කර්නල්	එස්එස්ඩී රසික කුමාර පීඑස්සී	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී - විශ්‍රාම වැටුප්
41	ලුතිනන් කර්නල්	ඒයූ ප්‍රියන්ත ආර්එස්පී	අණදෙන නිලධාරී - කැබිතිගොල්ලෑව
42	ලුතිනන් කර්නල්	ජේජේඩබ්කේ ද සිල්වා	සේවා වනිතා සම්බන්ධීකරණ නිලධාරී
43	මේජර්	ඒ වර්ණකුලසූරිය	මාණ්ඩලික නිලධාරී ව්‍යාපෘති (නඩත්තු හා ඉදිකිරීම්)
44	මේජර්	ආර්එම් විජේසිංහ	ව්‍යාපෘති අධීක්ෂණ නිලධාරී - කුරගල
45	මේජර්	ඩබ්ඒකේසී ප්‍රියන්ත	දෙවන අණදෙන නිලධාරී- වෙන්නවත්ත
46	මේජර්	කේසී අලකංක ආර්එස්පී	මාණ්ඩලික නිලධාරී ප්‍රසම්පාදන/ක්‍රීඩා
47	මේජර්	එම්එඒඩී කුමාර	අණදෙන නිලධාරී - මැදිරිගිරිය
48	මේජර්	ජේපී විජේතුංග	මාණ්ඩලික නිලධාරී ව්‍යාපෘති (කෘෂී)
49	මේජර්	ටිජීටීඑන් ආරියදාස	දෙවන අණදෙන නිලධාරී - මහඔය
50	මේජර්	එච්එම්එන්එන් ප්‍රේමජයන්ත	මාණ්ඩලික නිලධාරී (මෙහෙයුම්)
51	කපිතන්	ටීඩබ්එම්කේ අබේසිංහ ආර්ඩබ්පී	උප බලකා භාර නිලධාරී - වැලිසර
52	කපිතන්	ඒඩබ්එස්එස් වඩුගේ	දෙවන අණදෙන නිලධාරී - කොණ්ඩච්චි
53	කපිතන්	ආර්ඩීආර්එම් ජයලත්	මාණ්ඩලික නිලධාරී (ප්‍රවාහන)
54	කපිතන්	ආර්ඒඩීසී රණවක	නීති නිලධාරී
55	කපිතන්	සීඑච්ඒ පෙරේරා	අධ්‍යක්ෂ ජනරාල් අධිසහායක

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	රියර් අද්මිරාල්	යුඅයි සේරසිංහ ඩබ්ඩබ්වී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඒඕඩබ්සී	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
2	කොමදෝරු	ජීආර්ඩීඑස් ගමීලත් යූඑස්පී	අධ්‍යක්ෂ ප්‍රසම්පාදන
3	කපිතාන්	ආර්පීඑස් රණසිංහ	අණදෙන නිලධාරී - කටුනායක
4	කොමාන්ඩර්	ටීආර් සහබන්දු	විශේෂ විමර්ශනහාර ස්ථානාධිපති
5	කොමාන්ඩර්	කේයුසි පෙරේරා	අණදෙන නිලධාරී - කොණ්ඩච්චි ව්‍යාපෘතිය
6	ලුතිනන් කොමාන්ඩර්	එන්පී අදස්සූරිය	දෙවන අණදෙන නිලධාරී - කතරගම
7	ලුතිනන් කොමාන්ඩර්	එස්එම්ඒ ශාන්ත	දෙවන අණදෙන නිලධාරී - අම්පාර
8	ලුතිනන් කොමාන්ඩර්	ආර්ආර් හේවාපතිරණ	මාණ්ඩලික නිලධාරී (ප්‍රසම්පාදන)
9	ලුතිනන් කොමාන්ඩර්	එම්ජේපීටීඑස් පතිරණ	ව්‍යාපෘති අධීක්ෂණ නිලධාරී
10	ලුතිනන් කොමාන්ඩර්	ඒඑම්සීආර් කුමාර	දෙවන අණදෙන නිලධාරී - මූලස්ථානය
11	ලුතිනන් කොමාන්ඩර්	එන්එස් කුමාරජෝති	නියෝජ්‍ය අධ්‍යක්ෂ තාක්ෂණ

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	ස්කෝඩ්‍රන් ලීඩර්	එස්යූපීකේ ලින්කන්	අධ්‍යක්ෂ ජනරාල් සහකාර ලේකම්

ශ්‍රී ලංකා පොලිස් කාර්ය මණ්ඩලය

අ/අ	නිලය	නිලධාරියාගේ නම	තනතුර
1	කාප්‍රපොප	එස්කේ මහානාම	මාණ්ඩලික නිලධාරි දුක්ගැනවිලි (විශේෂ විමර්ශණ අංශය)
2	පොප	එස්එස් සරත් සමන්ත	උප බලකා අණහාර නිලධාරි - ලාහුගල
3	පොප	ජේඑල්පී ප්‍රියදර්ශන	දෙවන අණදෙන නිලධාරි - මහනුවර
4	පොප	එම්එස්පීආර්කේ මුණසිංහ	දෙවන අණදෙන නිලධාරි - සේරුවිල
5	පොප	ඩීඑච්එල්ඩබ් ජයසිංහ	ස්ථානාධිපති - මිහින්තලය උප බලකාය
6	උපොප	ආර්ඒයු රූපසිංහ	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලේකම්
7	උපොප	ඩබ්එම්ආර්කේ වික්‍රමසිංහ	දෙවන අණදෙන නිලධාරි - පහළලන්ද පුහුණු පාසල
8	උපොප	එච්එම්එල්ටී හේරත්	දෙවන අණදෙන නිලධාරි - සේරුපිට පුහුණු පාසල
9	උපොප	එස්එස් තිලකරත්න	මාණ්ඩලික නිලධාරි - මූලස්ථාන බලකාය
10	උපොප	වයිබීඑන් බන්දුල	දෙවන අණදෙන නිලධාරි - ත්‍රිකුණාමලය
11	උපොප	බීජීඒටී බණ්ඩාර	දෙවන අණදෙන නිලධාරි - ගෝමරන්කඩවල
12	උපොප	ඩබ්එම්ඩබ් කුලතිලක	මාණ්ඩලික නිලධාරි - විහාරමහාදේවි උද්‍යානය
13	උපොප	ඒටීජීඩීටීසී ප්‍රියදර්ශන	දෙවන අණදෙන නිලධාරි - කටුනායක
14	උපොප	බීජී ගාමිණි	අතිරේක නිලධාරි - මැදිරිගිරිය
15	උපොප	ජේ විජේවර්ධන	දෙවන අණදෙන නිලධාරි - අනුරාධපුර
16	උපොප	පීකේ ජයතුංග	මාණ්ඩලික නිලධාරි - වැලිසර උප බලකාය

දීපව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය

අ/අ	ස්ථිර සේවය	නිලධාරියාගේ නම	තනතුර
1	ශ්‍රීලංගසේ I	ආර්ආර් බුලත්සිංහල මහත්මිය	අධ්‍යක්ෂ මුදල්
2	ශ්‍රීලංගසේ III	ජේඒ ජෙරීඩ් මහතා	සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
3	ශ්‍රීලංපසේ III	කේකේපීඑස් රත්නායක මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පාලන)
4	ශ්‍රීලංගසේ III	එච්එම්ඩී සිල්වා මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)
5	ශ්‍රීලංගසේ III	ඩීඑම් සජීවනී මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)
6	ශ්‍රීලංගසේ III	වීආර් සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)
7	ශ්‍රීලංපසේ III	ඩී.එන්.කේ. ජයනන්ද මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (පාලන)

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 320

පටුන

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාර්ය මණ්ඩලය 3

ශ්‍රී ලංකා නාවික හමුදා කාර්ය මණ්ඩලය 4

ශ්‍රී ලංකා ගුවන් හමුදා කාර්ය මණ්ඩලය 5

දීපව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය .....

1 **ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය** 8

1.1 හැඳින්වීම 8

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 8

1.2.1 දැක්ම 8

1.2.2 මෙහෙවර 8

1.3 ප්‍රධාන කාර්යයන් 8

1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති 9

1.4 සංවිධාන සටහන 10

1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ 12

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 13

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 13

2 **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** 14

2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය 14

2.1.1 එක් එක් බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු මඟින් 2022 වර්ෂය තුළ රජයේ අදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන 15

2.2 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය 16

2.3 වෙරළ පවිත්‍ර කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය 16

2.4 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය 17

2.5 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය 18

2.6 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය 17

2.7 විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු 18

2.8 පාසල් හා පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම 19

2.8.1 දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ගුරුවරුන් අනුයුක්ත කිරීම 19

2.8.2 ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම 19

2.9 ජාතික අවශ්‍යතාවයන් මත හට පිරිස් කළමනාකරණය 19

2.9.1 දඹේ කෘෂි ව්‍යාපෘතිය 19

2.9.2 තංගල්ල නෙටොල්පිටිය කෘෂි ව්‍යාපෘතිය 20

2.9.3 ටොම් ඊ ජේ සි අඹ ව්‍යාපෘතිය 20

2.9.4 අම්පාර බලකාය මඟින් පවත්වාගෙන යනු ලබන කෘෂි ව්‍යාපෘති 21

2.10 ඩෙංගු මර්දන වැඩසටහන් පැවැත්වීම 21

2.11 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම 22

2.12 සමාජ සුභසාධන ක්‍රියාකාරකම් 22

2.13 නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි 23

2.14 බලකා මඟින් ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති 23

3 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 24

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 24

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 26

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 27

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 29

3.4.1 වාර්තා කිරීමේ පදනම 29

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 30

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 30

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 30

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 31

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 32

4 කාර්යසාධන දර්ශක 46

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 46

5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 47

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 47

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 50

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ 50

5.2.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග 50

6 මානව සම්පත් පැහිකඩ 51

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 51

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය 52

6.3 මානව සම්පත් සංවර්ධනය 53

7 අනුකූලතා වාර්තාව 55

1 ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1985 අංක 40 දරන මිනිස් බල උපයෝගීතා සහ පරිපූරක හමුදා පනතේ 52 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා පොලිස් සේවාවට ආධාර හා උපකාරීවීමේ කාර්යය සඳහා පිහිටුවන ලද ග්‍රාමාරක්ෂක හමුදාව, 2006.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය (අමප/06/135/206/052) අනුව "සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව" නමින් නව දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23ක් සහ පුහුණු පාසල් 04ක් ස්ථාපිත කර ඇති අතර 35,000කට ආසන්න ශ්‍රම බලකායක් සේවයේ යෙදී සිටී.

2015 ජූනි මස 12 වැනි සිකුරාදා දිනැතිව නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ පැවති දිස්ත්‍රික් නිලධාරී, පාලක/නියාමක, උප පාලක/උප නියාමක, ග්‍රාම ආරක්ෂක/සිවිල් ආරක්ෂක තනතුරු විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශයට පත් කර ඇත. තවද 2015 මාර්තු මස 05 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුව සතු සුවිශාල මිනිස් බල සංචිතය ඵලදායී ලෙස යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල සංවර්ධන කටයුතු සිදු කිරීමේ හැකියාව සහ දෙපාර්තමේන්තුව ආදායම් උත්පාදනය කරන ආයතනයක් බවට පත්කිරීමේ හැකියාව සලකා දෙපාර්තමේන්තු කාර්යභාරය තවදුරටත් පුළුල් කරනු ලැබීය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 දැක්ම

“ තිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් ”

1.2.2 මෙහෙවර

“ශ්‍රී ලංකා මාතෘ භූමියේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට දිවි හිමියෙන් කැප වෙමින් ද, ජාතික සංවර්ධන හා ආර්ථික වර්ධන ඉලක්ක සාක්ෂාත් කරමින් ද, ‘පරිපූරක ශ්‍රම ආර්ථික බලකායක්’ ලෙස සෞභාග්‍යයේ දැක්මට විශිෂ්ට පෙර ගමන්කරුවකු වීම.”

1.3 ප්‍රධාන කාර්යයන්

1. රටතුළ උද්ගතවන ආරක්ෂක තත්ත්වයන් අනුව අවස්ථාවට උචිත පරිදි සන්නද්ධ සේවාවලට සහ පොලිස් සේවාවට ආධාර හා උපකාරී වීම සඳහා පරිපූරක හමුදාවක් වශයෙන් කටයුතු කිරීම.
2. ත්‍රස්තවාදී තර්ජන පවතින අවස්ථාවලදී ඊට ලක්වන ගම්බිම් හා නගර ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
3. රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සන්නද්ධ හමුදාවන්ට සහ පොලිස් සේවාවට සහාය දීම.
4. ජාතික වැදගත්කමක් ඇති උත්සව හා වෙනත් වැදගත් අවස්ථාවන්හිදී ඊට අදාළ ආරක්ෂාව සැලසීමේ කටයුතුවල යෙදීම.
5. රට තුළ ඇතිවන විවිධ ආපදා අවස්ථාවන්හිදී (ගංවතුර, සුනාමි, නායයාම් වැනි) ආපදා කළමනාකරණ කාර්යන්වලට සහාය වීම.
6. පළාත් සභා සහ පළාත් පාලන ආයතන, විහාරස්ථාන හා ආගමික සිද්ධස්ථාන ආදියෙහි සුළු හා මධ්‍යම පරිමාණ ඉදිකිරීම් කටයුතු ඉටු කරවා ගැනීමේදී ශ්‍රම බලකායේ සේවය ලබාදීම.

7. රාජ්‍ය ආයතනවලට ආරක්ෂක සේවා සපයා ගැනීමේදී මෙම දෙපාර්තමේන්තුව සමග ගිවිසුම්ගතව ආරක්ෂක සේවාවන් ලබාදීම.

8. දෙපාර්තමේන්තුව සතු සංස්කෘතික කණ්ඩායම්වල සේවය රාජ්‍ය ආයතනවල උත්සව අවස්ථාවන් සඳහා ලබාදීම.

9. අලි මිනිස් ගැටුම් හේතුවෙන් අදාළ ප්‍රදේශවල සිදුවන හානි අවම කිරීම පිණිස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සහායවීම සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ සේවය එම දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

10. දිවයින පුරා පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානවල ආරක්ෂාව තහවුරු කිරීම සහ සංචාරක වශයෙන් වැදගත්කමක් ඇති ස්ථාන සඳහා අවශ්‍ය වන පරිදි ආරක්ෂාව සැලසීම.

11. සමාජ සුබසාධන ක්‍රියාකාරකම්වලට සහාය වීම.

12. ජනාධිපතිතුමා, විෂයභාර අමාත්‍යතුමා හෝ රජය විසින් නියම කරනු ලබන විශේෂිත කාර්යයන්වල යෙදීම.

1.3.1 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට පවරා ඇති විවිධ විශේෂ ව්‍යාපෘති

අංක 1462 / 20 හා 2006.09.13 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍රයෙන් සහ 2015 මාර්තු 05 දිනැති අංක අ/ම/ප/15/0089/610/003 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් පවරන ලද ඉහත රාජකාරිවලට අමතරව රජය විසින් වරින් වර පහත සඳහන් රාජකාරි ද පවරා ඇත.

- දිවයින පුරා වී, ධාන්‍ය, එළවළු, පලතුරු, පශු ආදී විවිධ මහා පරිමාණ ව්‍යාපෘති මඟින් රටේ ජාතික ආහාර නිෂ්පාදනය ශක්තිමත් කිරීම.

- අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටුවා ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මඟින් යහපත් ළමා පරපුරක් බිහි කිරීමට සහාය වීම.

- ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම.

- උතුරු හා උතුරුමැද ප්‍රදේශ ආවරණය වන පරිදි විශාල ප්‍රමාණයේ ජල පෙරණ යන්ත්‍ර ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම.

1.4 සංවිධාන සටහන


සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ඒකාබද්ධ සේවයේ රියදුරු - 30,
නියාමක (විශේෂ /I) - 3200, උප නියාමක - 6510, සිවිල් ආරක්ෂක හට - 29790, නියාමක (විශේෂ) රියදුරු - 30, නියාමක (I) - 70, , උප නියාමක රියදුරු - 90, සිවිල් ආරක්ෂක හට රියදුරු - 210,
සනීපාරක්ෂක කම්කරු - 30

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු

බලකා/පුහුණු පාසල්/ව්‍යාපෘති කාර්යාල ස්ථානගත වීම



1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ බලකා මූලස්ථාන 23ක් සහ පුහුණු පාසල් 04ක් ක්‍රියාත්මක වන අතර බලකා මූලස්ථාන/පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සහ දෙවන අණදෙන නිලධාරීන් මඟින් එකිනෙක බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්හි පරිපාලන කටයුතු සිදු වේ.

දෙපාර්තමේන්තුව සතු 35,000කට ආසන්න මානව සම්පත විවිධ ක්ෂේත්‍රගත ව්‍යාපෘති වෙත යොමු කරවීම දෙපාර්තමේන්තු මූලස්ථානයේ මෙහෙයවීමෙන් බලකා මූලස්ථාන/පුහුණු පාසල් මඟින් සිදු කෙරේ.

බලකා මූලස්ථාන - 24

1. මූලස්ථානය
2. වෙන්නවත්ත බලකා මූලස්ථානය
3. කටුනායක බලකා මූලස්ථානය
4. මහනුවර බලකා මූලස්ථානය
5. පුත්තලම බලකා මූලස්ථානය
6. අනුරාධපුර බලකා මූලස්ථානය
7. විල්පත්තුව බලකා මූලස්ථානය
8. වව්නියාව බලකා මූලස්ථානය
9. කිලිනොච්චි බලකා මූලස්ථානය
10. විශ්වමඩු බලකා මූලස්ථානය
11. මුලතිව් බලකා මූලස්ථානය
12. වැලිඔය බලකා මූලස්ථානය
13. කැබිතිගොල්ලෑව බලකා මූලස්ථානය
14. හොරොව්පොතාන බලකා මූලස්ථානය
15. ගෝමරන්කඩවල බලකා මූලස්ථානය
16. ත්‍රිකුණාමලය බලකා මූලස්ථානය
17. සේරුවිල බලකා මූලස්ථානය
18. පොළොන්නරුව බලකා මූලස්ථානය
19. මැදිරිගිරිය බලකා මූලස්ථානය
20. මහඔය බලකා මූලස්ථානය
21. උහන බලකා මූලස්ථානය
22. අම්පාර බලකා මූලස්ථානය
23. මොණරාගල බලකා මූලස්ථානය
24. කතරගම බලකා මූලස්ථානය

පුහුණු පාසල් - 04

1. සේරුපිට සෞන්දර්ය පුහුණු පාසල
2. කල්පිටිය පුහුණු පාසල
3. ගල්කිරියාගම උසස් පුහුණු පාසල
4. පහළලන්ද පුහුණු පාසල

දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් බලකා මූලස්ථාන සහ පුහුණු පාසල්වලට අදාළ පාලන කටයුතු සිදු කරන අතර දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශ 23ක් යටතේ එම පාලන කාර්යන් විමධ්‍යගත කර ඇත.

i. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය
ii. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
iii. අභ්‍යන්තර විගණන අංශය
iv. ආයතන අංශය
v. ගිණුම් අංශය
vi. වැටුප් අංශය
vii. මෙහෙයුම් අංශය
viii. පිරිස් පාලන අංශය
ix. ප්‍රසම්පාදන අංශය
x. ප්‍රවාහන අංශය
xi. පුහුණු අංශය
xii. ව්‍යාපෘති අංශය
xiii. සුබසාධක අංශය
xiv. තාක්ෂණ හා නඩත්තු අංශය
xv. පර්යේෂණ හා සංවර්ධන අංශය
xvi. මාධ්‍ය අංශය
xvii. ක්‍රීඩා අංශය
xviii. පෞද්ගලික ලිපි ගොනු අංශය
xix. විදුලි වැට සම්බන්ධීකරණ ඒකකය
xx. සේවා වනිතා ඒකකය
xxi. යහසාධක අරමුදල
xxii. සුවසවිය අරමුදල
xxiii. විශ්‍රාම වැටුප් අංශය

එක් එක් බලකා මූලස්ථාන, පුහුණු පාසල් සහ දෙපාර්තමේන්තු මූලස්ථානයෙහි අංශයන්ට අදාළව 2022 වර්ෂය සඳහා සැලසුම්ගත කාර්යන්හි කාර්යසාධනය වෙන් වෙන්ව දක්වා ඇත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

- සුවසවිය අරමුදල
- යහසාධක අරමුදල
- සුබසාධන අරමුදල
- ක්‍රීඩා අරමුදල
- ආගමික අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) ව්‍යාපෘතියේ නම -

ආ) දායක නියෝජිතායතනය -

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මි -

ඈ) ව්‍යාපෘති කාල සීමාව -

} නැත

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 දෙපාර්තමේන්තු ප්‍රගතිය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යුධ විජයග්‍රහණයෙන් පසු නැගෙනහිර නවෝදය, උතුරු වසන්තය, සෞභාග්‍යයේ පෙර දැක්ම වැනි රජයේ ජාතික සංවර්ධන සංග්‍රාමයන්ට දායක විය. ඒ අනුව, රටේ ආහාර ඉල්ලුමට සරිලන වී, ධාන්‍ය, එළවලු වැනි මහා පරිමාණ කෘෂි, පශු ව්‍යාපෘතීන් ද, ගඩොල්, බ්ලොක් ගල් වැනි ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය ව්‍යාපෘතීන් ද ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතීන් මේ වන විට වාර්ෂිකව ඉතා විශාල මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරනු ලබන දීර්ඝ කාලීන ආයෝජන ලෙස ක්‍රියාත්මක වන අතරම, රටේ ජාතික සංවර්ධනයට ද අඛණ්ඩ දායකත්වයක් දරනු ලබයි.

ඊට අමතරව මෙම දෙපාර්තමේන්තු භටයන් රාජ්‍ය ආයතන වලආරක්ෂක රාජකාරි, නර්තන හා සංගීත කණ්ඩායම් සේවා, ඉදිකිරීම්, නඩත්තු හා විවිධ සේවා සැපයීම තුළින් ද අදායම් උත්පාදනය කිරීමට සමත් වී ඇත.

ඒ අනුව, උක්ත ආදායම් ලෙස, 2022 වර්ෂය තුළ පමණක් රුපියල් මිලියන 1565ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඇත.

2014 වර්ෂයේ සිට වාර්ෂිකව රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති ආදායම් විස්තර පහත පරිදි වේ.

ව්‍යාපෘති කාණ්ඩය	2014 රු. මි	2015 රු. මි	2016 රු. මි	2017 රු. මි	2018 රු. මි	2019 රු. මි	2020 රු. මි	2021 රු. මි	2022 රු. මි
කෘෂි පශු ගඩොල්	27	295	631	541	375	382	482.5	379.2	655.3
ආරක්ෂක සේවා ආදායම්	38	25	204	312	491	606	375.7	320.5	741.7
නර්තන හා සංගීත ආදායම්	-	-	27	11	6	17	3	1.6	4.6
නඩත්තු සේවා ආදායම්	-	-	23	19	22	24	17.5	25.58	67.3
ඉදිකිරීම් සේවා ආදායම්	-	-	30	58	87	102	90.5	1.57	6.4
විවිධ ආදායම්	4	3	141	202	16	25	9	41.06	89.7
එකතුව	69	323	1,056	1,143	997	1,156	978.2	769.5	1565



2.1.1 එක් එක් බලකා මූලස්ථාන , පුහුණු කඳවුරු මඟින් 2022 වර්ෂය තුළ රජයේ ආදායමට බැර කරන ලද ව්‍යාපෘති හා සංස්කෘතික ආදායම් සටහන

2022 වර්ෂයට අදාළව ඉහත 2.1. වගුව මඟින් කෘෂි, පශු, ගඩොල් යන කාණ්ඩ යටතේ පොදුවේ දක්වා ඇති ආදායම ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වෙන් වෙන් වශයෙන් ඒ ඒ ආයතනයන්හි ප්‍රගතිය ලෙස පහත දක්වා ඇත. තවද, පහත දක්වා ඇති ආදායම් හා ව්‍යාපෘති ඒ ඒ බලකා මූලස්ථාන, පුහුණු කඳවුරු යටතේ වැඩිදුරටත් සවිස්තරාත්මකව දක්වා ඇත.

බලකා මූලස්ථාන / පුහුණු පාසල් / උප බලකා / ව්‍යාපෘති	2022 වර්ෂයේ රජයේ ආදායමට බැර කරන ලද මුදල (රු.)
මූලස්ථානය / සේරුපිට	7,382,633.10
වෙන්නවත්ත	2,287,716.70
කටුනායක	200,700.00
මහනුවර	686,317.75
පුත්තලම	28,110,915.75
අනුරාධපුර	9,817,553.00
විල්පත්තුව	7,724,208.50
වව්නියාව	19,808,266.30
කිලිනොච්චි	25,867,002.98
විශ්වමඩු	27,620,466.30
මුලතිව්	17,335,285.00
වැලිඔය	64,729,838.26
කැබිතිගොල්ලෑව	32,043,382.10
හොරොව්පොතාන	40,444,789.00
ගෝමරන්කඩවල	27,208,303.09
සේරුවිල	36,117,433.36
පොළොන්නරුව	17,688,951.68
මැදිරිගිරිය	17,929,869.66
මහඔය	32,839,642.14
උහන	62,136,708.31
අම්පාර	57,763,643.30
මොණරාගල	57,361,299.00
කතරගම	1,634,770.00
ගල්කිරියාගම	1,213,400.00
කල්පිටිය	367,341.00
කන්තලේ	43,275,073.84
කොන්ඩච්චිය	15,659,000.00
කුරගල ව්‍යාපෘතිය	20,150.00
එකතුව	**655,274,660.12**



2.2 පරිපූරක හමුදාවක් ලෙස ක්‍රියා කිරීම සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මානව සම්පත් කළමනාකරණය

යුධ විජයග්‍රහණයෙන් අනතුරුව රට තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවට සහ පොලිස් සේවාවට සහාය වීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වේ. ඒ අනුව 2022 වර්ෂය තුළ දිවයින පුරා පොලිස් ස්ථාන 314ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයින් 2182ක් අනුයුක්ත කර ඇත. මෙම කාර්යන් ඉදිරි වර්ෂයන්හී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ඊට අමතරව පහත පරිදි දෙපාර්තමේන්තු මානව සම්පත විවිධ කාර්යයන්හි යොදවා ඇත.

කාර්යය	හට සංඛ්‍යාව
පුරාවිද්‍යා හා භූජාඟුම් ආරක්ෂක/නඩත්තු	2539
රාජ්‍ය ආයතන ආරක්ෂක	2108
විදුලි වැට නඩත්තු සඳහා	3274
වන අලි කළමනාකරණය හා වන අලි පලවා හැරීම	1291
නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි	120
ආපදා කළමනාකරණ කටයුතු සඳහා ජීවිතාරක්ෂක කණ්ඩායම	98





2.3 වෙරළ පවිත්‍ර කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය

දෛනිකව වෙරළ තීරයට එක්රැස්වන අපද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව ඉවත් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ උපදෙස් සහ පූර්ණ අධීක්ෂණය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ හටයින්ගේ ශ්‍රම දායකත්වයෙන් සිදු කරනු ලැබේ.





2.4 ජාතික උත්සව සහ වෙනත් වැදගත් අවස්ථා සඳහා දායකත්වය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපති හා සේනාධිනායක අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ නිදහස් චතුරස්‍රයේදී පෙබරවාරි 04 වන දින පෙරවරුවේ පැවති 74 වන නිදහස් දින සැමරුම් පෙළපාලිය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මහත් අභිමානයෙන් සහභාගී විය.

නිදහස් සැමරුම් උළලේ ආචාර පෙළපාලිය සඳහා නිලධාරීන් 14 දෙනෙකුගෙන් සහ සිවිල් ආරක්ෂක භටයින් 382 දෙනෙකුගෙන් සමන්විතව අංශ දෙකක් සමඟ තූර්ය වාදක කණ්ඩායම සහ සංස්කෘතික කණ්ඩායමද සහභාගී විය.







2.5 යලි පිබිදෙන කුරගල පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂාව හා පුදබිම ඉදිකිරීම් ව්‍යාපෘතිය

2013.04.26 වන දින එවක ආරක්ෂක ලේකම් හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් කුරගල සංචාරයේදී අන්‍යාගමික ග්‍රහණයට නතුවී තිබූ කුරගල පුරාවිද්‍යා ස්මාරක සහිත පූජණීය ස්ථාන මුල්කොට ගෙන එම ගමෙහි පදිංචි තරුණ පිරිස් 54 දෙනෙකු බදවාගෙන කුරගල පුජා භූමි සංරක්ෂණ කටයුතු සඳහා යොදවා ඇත. පසුව එම කටයුතු අවසන් වූ පසු මෙම ස්ථානය වෙන්නවත්ත බලකා මූලස්ථානයට අනුබද්ධ ව්‍යාපෘති කාර්යාලයක් බවට පත්කර ඉන් අනතුරුව කතරගම බලකායට අනුයුක්තව මෙම ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යන අතර මේ වන විට 200 කින් යුත් භට පිරිසක් සමඟ කුරගල ව්‍යාපෘති කාර්යාලය නමින් වගා ව්‍යාපෘති , රාජ්‍ය ආයතන ආරක්ෂක රාජකාරි, ආදීයෙහි භටපිරිස් යොදවා කුරගල ව්‍යාපෘති කාර්යාලයක් ලෙස පවත්වාගෙන යනු ලබයි.







2.6 ඉදිකිරීම් කටයුතු සඳහා දායකත්වය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා පෙදරේරු, වඩු, විදුලි කාර්මික, ජලනල කාර්මික වැනි ක්ෂේත්‍රයන්ගේ පුහුණු සිවිල් ආරක්ෂක ශ්‍රමිකයන්ගේ සේවය රාජ්‍ය අංශයේ විවිධ ආයතන වෙත හා ආගමික සිද්ධස්ථාන වෙත ලබා දෙනු ලබයි.

ඒ යටතේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සාරාංශය පහත පරිදි වේ.

අනු අංකය	ඉදිකිරීම් ව්‍යාපෘතියේ විස්තර	යොදවා ඇති හටයින් ගණන
1	පල්ලංසේන බන්ධනාගාරයේ දෙමහල් ගොඩනැගිලි 04ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	20
2	රාජ්‍ය ඔසුසල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පුහුණු/නුපුහුණු ශ්‍රම දායකත්වය ලබා දීම.	06
3	අපේ ගම පරිශ්‍රය පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම	05





2.7 විදුලි වැට ඉදිකිරීම් හා නඩත්තු කටයුතු

අලිමිනිස් ගැටුම් බහුලව පවතින ප්‍රදේශවල මිනිසුන්ගේ හා අලි ඇතුන්ගේ ජීවිත බේරා ගැනීම සඳහා වනජීවී අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වන අලි කළමනාකරණ හා පලවා හැරීම්, අලිවැට ඉදිකිරීම් හා නඩත්තු ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ සිවිල් ආරක්ෂක හටයන් 4565ක් යොදවා 4638.112 Km ක දිගින් යුක්ත වන විදුලි වැටවල් 318 ක් නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.





2.8 පාසල් හා පෙර පාසල් දූ දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම

2.8.1 දුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල් වෙත ගුරුවරුන් අනුයුක්ත කිරීම

දිවයිනේ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පිහිටි ගුරුවරුන් හිඟ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරනු වස්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සුදුසුකම් ලත් ගුරුවරුන් 181 ක් පාසල් 139 ක් වෙත අනුයුක්ත කර ඇත. ඔවුන් විසින් 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි දරුවන් එම විභාගයන්ගෙන් විශිෂ්ට ලෙස සමත් කරවීමට කටයුතු කර ඇත. එබැවින්, පළාත් මට්ටමින් ඔවුන් ඇගයීමට ද ලක් වී ඇත.

2.8.2 ගුරු හිඟය පවතින දුෂ්කර පාසල් සඳහා ස්වේච්ඡා පදනමින් ගුරුවරු ලබා දීම

මේ යටතේ විශේෂයෙන්ම උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වල පාසල් 138ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 186ක් අනුයුක්ත කර ඇත.





2.9 ජාතික අවශ්‍යතාවයන් මත හට පිරිස් කළමනාකරණය

රජය විසින් ක්‍රියාත්මක කරන අත්‍යවශ්‍ය එළවළු වර්ග, කිරි නිෂ්පාදනය සහ ධාන්‍ය වර්ගවලින් මෙරට ස්වයංපෝෂිත කිරීම හා ශ්‍රී ලංකාව තුළ හරිත කෘෂි කර්මාන්තයක් බිහිකිරීම මූලික අරමුණු කර ගෙන 2022 වර්ෂයේදී වැඩි හට පිරිස් ප්‍රමාණයක් අනුයුක්ත කරන ලදී.

2.9.1 දඹේ කෘෂි ව්‍යාපෘතිය

කතරගම බලකා මූලස්ථානය යටතේ පවත්වාගෙන යනු ලබන කතරගම අනු කාර්යාලයට අනුයුක්ත භටයින් දෙදෙනෙකු යොදවා දඹේ ගොවිපලේ 2022 මහ කන්නයේ අක්කර දෙකක භූමි ප්‍රමාණයක වී වගාවක් ආරම්භ කර ඇත.





2.9.2 තංගල්ල නෙටොල්පිටිය කෘෂි ව්‍යාපෘතිය

කතරගම බලකා මුලස්ථානය යටතේ පවත්වාගෙන යනු ලබන තංගල්ල අනු කාර්යාලයට අනුයුක්ත සිවිල් ආරක්ෂක සාමාජිකයින් 08 දෙනෙකු යොදවා තංගල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් තාවකාලික පදනම මත ලබාදෙන ලද නෙටොල්පිටිය කොක්වත්ත ප්‍රදේශයේ පිහිටි අක්කර 08 ක භූමි ප්‍රමාණයෙන් අක්කර දෙකක භූමි ප්‍රමාණයක කහ වගාවත්, අක්කර 2 ½ ක බටු වගාවත්, අක්කර 2 ½ මඤ්ඤොක්කා වගාවත්ද, ආරම්භ කරන ලදි.







2.9.3 ටොම් ඊ ජේ සි අඹ ව්‍යාපෘතිය

රටෙහි ආර්ථිකය හා පෝෂණ මට්ටම ශක්තියක් වීමේ අරමුණින් ත්‍රිකුණාමලය බලකාය මඟින් අක්කර 12.5ක ටොම් ඊ ජේ සී ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන අතර නිවැරදි නඩත්තුව මඟින් මේ වන විට සැලකිය යුතු සාර්ථක අස්වැන්නක් හා ඉලක්ක ගත මාසික ආදායමක් ලබා ගනිමින් පවති. තවද ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් මෙම අඹ ව්‍යාපෘතිය දිස්ත්‍රික්කයේ ඇති විශාලතම ආර්ථික ව්‍යාපෘතිය ලෙස ද හඳුන්වා ඇත.







2.9.4 අම්පාර බලකාය මඟින් පවත්වාගෙන යනු ලබන කෘෂි ව්‍යාපෘති

උක් ව්‍යාපෘතිය



ගස්ලබු ව්‍යාපෘතිය



කරංකෝව වී ව්‍යාපෘතිය



2.10 ඩෙංගු මර්දන වැඩසටහන් පැවැත්වීම

2022 වර්ෂයේ ප්‍රදේශය තුළ ඩෙංගු මදුරුවන් බෝවීම විශාල වශයෙන් පැතිරීම හේතුවෙන් බලකා බල ප්‍රදේශය තුළ ඇති පොදු ස්ථාන හා ඩෙංගු බෝවීමේ ස්ථාන හඳුනාගෙන ප්‍රාදේශිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ සහයෝගයෙන් විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.









2.11 මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ප්‍රදේශය තුළ තරුණ තරුණියන් හා ළමා පරපුර මත්ද්‍රව්‍ය භාවිතයට විශාල වශයෙන් නැඹුරුවීම හේතුවෙන් එය අවම කර ගැනීම හා මතින් නිදහස් කර ගැනීමේ අරමුණින් බලකා මුලස්ථානය තුළ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව විශේෂ පුහුණුව ලත් උපදේශකයින් යොදවා බලකාය තුළ හා බලකා බල ප්‍රදේශය තුළ උපදේශන වැඩසහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීමට කටයුතු කර ඇත.





2.12 සමාජ සුභසාධන ක්‍රියාකාරකම්

දඹුල්ල, මාතලේ යන ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් බෙදා දීම සහ ඇස් කන්ණාඩි බෙදා දීමේ වැඩසටහන





මහනුවර බලකා මූලස්ථාන පරිශ්‍රයේ පැවති පොල් පැළ බෙදීමේ සහ බලගොල්ල නැගෙනහිර වසමේ අඩු ආදායම්ලාභී පවුල් 30 ක් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දීමේ වැඩසටහන





2.13 නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි

විහාර මහා දේවී උද්‍යානය, කාක දූපත වෙරළ උද්‍යානය, කොළඹ පාවෙන වෙළඳ සංකීරණය, මාදිවෙල ඇවිදින මංතිරුව ආදී ස්ථාන රාශියක නගර අලංකරණ ව්‍යාපෘති රාජකාරි සඳහා භටයන් 250 දෙනෙකු වර්ෂය පුරා රාජකාරියෙහි අනුයුක්ත කර ඇත.





2.14 බලකා මඟින් ක්‍රියාත්මක වන වෙනත් ව්‍යාපෘති



රෝහල් අළුත්වැඩියාව වෙනුවෙන් ශ්‍රමදායකත්වය ලබා දීම



වෙහෙර විහාරස්ථාන ඉදි කිරීමට අවශ්‍ය ශ්‍රමදායකත්වය ලබා දීම



දිසවාපිය මැටි භාණ්ඩ ව්‍යාපෘතිය



පොළොන්නරුව ගඩොල් ව්‍යාපෘතිය

3 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ - එෆ්

2022.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය රු.

අයවැය වර්තමාන වර්ෂය (2022)		සටහන	තත්‍ය රු.		
			වර්තමාන වර්ෂය 2022	ඉකුත් වර්ෂය නැවත ගළපන 2021	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		-	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		17,534,496,000	15,870,000,000	**ඒසිඒ -3**
-	තැන්පතු		1,164,671,237	845,298,908	**ඒසිඒ -4**
-	අත්තිකාරම් ගිණුම්		362,403,224	369,086,396	**ඒසිඒ - 5/5(අ)**
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**19,061,570,461**	**17,084,385,304**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**19,061,570,461**	**17,084,385,304**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**19,061,570,461**	**17,084,385,304**	
	අඩු කළා: වියදම		-	-	
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසිඒ -2(II)
19,028,495,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	18,289,562,501	16,621,075,668	
921,425,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	825,136,675	482,414,545	
38,560,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	36,505,437	18,040,947	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
19,988,480,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**19,151,204,613**	**17,121,531,160**	

	මූලධන වියදම්				
36,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	32,505,028	51,004,128	
12,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	11,506,192	31,517,671	
-	ප්‍රාග්ධන පැවරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	**ඒසිඒ - 2(II)**
3,000,000	හැකියා වර්ධනය	14	2,168,408	2,295,124	
160,600,000	වෙනත් මූලධන වියදම්	15	134,854,433	92,648,074	
212,600,000	**මුළු මූලධන වියදම් (උ)**		**181,034,062**	**177,464,997**	
	තැන්පතු ගෙවීම්		1,373,769,684	664,944,893	**ඒසිඒ -4**
	අත්තිකාරම් ගෙවීම්		335,524,124	385,346,482	**ඒසිඒ - 5/5(අ)**
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,709,293,808	1,050,291,375	
	මුළු වියදම එ = (ඊ+උ+ඌ)		21,041,532,483	18,349,287,532	
	දෙසැම්බර් 31 දිනට අඟ්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(1,979,962,023)**	**(1,264,902,228)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ -පි

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

			තත්‍ය
	සටහන	වර්තමාන වර්ෂය **2022**	ඉකුත් වර්ෂය **2021**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසිඒ -6**	2,314,614,772	2,306,368,580
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	**ඒසිඒ -5/5(අ)**	703,489,640	730,368,739
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසිඒ -3**	-	-
මුළු වත්කම්		**3,018,104,412**	**3,036,737,319**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		473,508,701	291,289,354
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		2,314,614,772	2,306,368,580
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ -5(ආ)**		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	**ඒසිඒ -4**	229,980,938	439,079,386
අග්‍රිම ශේෂය	**ඒසිඒ -3**	-	-
මුළු වගකීම්		**3,018,104,412**	**3,036,737,319**

පිටු අංක 23 සිට 25 දැක්වෙන ඉහත ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ අකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 26 සිට 28 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තරද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	ගණන් දීමේ නිලධාරී	ප්‍රධාන ගණකාධිකාරී
ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)	**මේජර් ජෙනරල් එන්ආර් ලමාභේවාගේ (විශ්‍රා)**	**ආර්. ආර්. බුලක්සිංහල**
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී	ආර්ඩබ්පී ආර්එස්පී එන්ඩීයූ	සිවිල් ආරක්ෂක
එන්ඩීසී පීඑස්සී එම්ෆිල්	අධ්‍යක්ෂ ජනරාල්	දෙපාර්තමේන්තුව
ලේකම්	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	
ආරක්ෂක අමාත්‍යාංශය		
දිනය : 2023. 05. 29	දිනය : 2023. 05. 17	දිනය : 2023. 05. 17

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය **2022**	ඉකුත් වර්ෂය නැවත ගලපන ලද **2021**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	රු.	රු.
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදයම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	2,343,545,361	1,625,982,850
අග්‍රිම ලැබීම්	17,534,496,000	15,870,000,000
අත්තිකාරම් අයකර ගැනීම්	360,988,811	367,836,993
තැන්පතු ලැබීම්	1,164,671,237	845,298,908
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	21,403,701,409	18,709,118,751
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	19,023,974,256	17,020,366,688
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	36,505,437	18,040,947
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	454,296,847	443,772,848
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		-
අත්තිකාරම් ගෙවීම්	334,121,122	384,528,377
තැන්පතු ගෙවීම්	1,373,769,684	664,944,893
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	21,222,667,346	18,531,653,754
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)	181,034,062	177,464,997
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම අත්තිකාරම් අය කර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-

<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	181,034,062	177,464,997
අත්තිකාරම් ගෙවීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	181,034,062	177,464,997
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) - (ඉ)	(181,034,062)	(177,464,997)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	0.00	0.00
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0.00	0.00
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0.00	0.00

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.4.1 වාර්තා කිරීමේ පදනම

1. **<u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**
2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. **<u>මිනුම්කරණ පදනම</u>**
මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. **<u>ආදායම් හඳුනාගැනීම</u>**
හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. **<u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>**
වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. **<u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**
මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. **<u>මුදල් හා මුදල් සමාන දෑ</u>**
2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7. **<u>දෙපාර්තමේන්තු පොත් තුළ හඳුනා නොගන්නා ලද මූල්‍ය නොවන වත්කම් (ජීව විද්‍යාත්මක වත්කම්) හෙළිදරව් කිරීම</u>**
ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවීම හේතුවෙන් 2022 මූල්‍ය ප්‍රකාශය තුළ මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනා නොගන්නා ලද ජීව විද්‍යාත්මක වත්කම් ඇමුණුම ix යටතේ හෙළිදරව් කර ඇත.

8. **<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් රැස් කරන ලද ආදායම</u>**
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 05/2022 ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව, වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද ආදායම 2022.12.31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය තුළ වාර්තා කර නොමැත. එය ඇමුණුම x යටතේ හෙළිදරව් කර ඇත.

9. **<u>2022.12.31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව</u>**
චක්‍රලේඛ අංක 01/2020 හි භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ 03 ප්‍රකාරව 2022.12.31 දිනට පිළියෙළ කරන ලද හිඟ ආදායම් පිළිබඳ වාර්තාව ඇමුණුම xi යටතේ අන්තර්ගතය.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොළිය	25,300,000	25,300,000	28,995,908	
20.03.99.00	විකුණුම් හා ගාස්තු	925,000	925,000	1,565,062,629	
20.04.01.00	නිවාස කුලී			745,646,410	
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	396,832	
20.06.02.01	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වාහන)	-	-	127,550	
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීම (වෙනත්)	-	-	3,316,032	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	20,030,580,000	19,988,480,000	19,151,204,613	95.81
ප්‍රාග්ධන	170,500,000	212,600,000	181,034,062	85.15

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
01	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	වැටුප් හා දිමනා ගෙවීම	88,522,075	88,522,075	88,522,075	100%
02	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් දුම්රිය බලපත්‍ර වියදම්	2,202,845	2,202,845	2,202,845	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	259,659,828.64	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	1,709,574,243.77	-	-
9153	ඉඩම්	-	284,669,000.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	60,711,700.00	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීඊඑස්/ඊ/සීඑස්ඩී/2022/FA
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2023 මැයි 24 දින

අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

ACCOUNTS PLANNING 310/23 29 MAY 2023 DEPARTMENT OF CIVIL SECURITY

යටේකුරු වාර්තාව සහ සහතික කළ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
2.ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. DEF/A/CSD/2022/FA

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 24 දින

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
862
29 MAY 2023
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල්,
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.
වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.5.(ආ) v	මුදල් රෙගුලාසි 880 හා 891 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු විධායක තනතුරු 06 කට හා ද්විතීයික තනතුරු 03 කට අදාළ නිලධාරීන් 65 දෙනෙකු අදාළ ඇප මුදල් තබා නොතිබුණි.	අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.
3.4	2016 වර්ෂයේ කතරගම බලකා මූලස්ථානයේ පළල අඩි 16 ක් හා දිග අඩි 903 ක් වන ප්‍රධාන අභ්‍යන්තර මාර්ග පද්ධතිය කොන්ක්‍රීට් අතුරා නවීකරණය කිරීම සඳහා ප්‍රදේශයේ පුද්ගලික ආයතනයකින් සිමෙන්ති, ගල්, වැලි ඇතුලු ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල් පත්‍රයකට රු.584,200 ක් ගෙවා තිබුණු අතර, අදාළ ඉදිකිරීම් ද්‍රව්‍ය මේවන තෙක් කතරගම බලකා මූලස්ථානයට ලැබී නොමැති අතර, එම මාර්ගයේ අලුත්වැඩියාවද සිදුකර නොතිබුණි.	අලුත්වැඩියාව කඩිනමින් සිදුකල යුතු වීම.
3.2.2.4	කතරගම බලකා මූලස්ථානයේ සෙසු නිල නිවාඩු නිකේතන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ශ්‍රම පිරිවැය හැර රු.මිලියන 11.13 ක වියදමකින් ඉදිකර තිබුණු යථෝක්ත ගොඩනැගිල්ල පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.	
(අ)	ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර අදාළ පලාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අනුමැතියකියන් තොරව අවස්ථා කිහිපයකදීම ගොඩනැගිලි සැලැස්ම සංශෝධනයකර තිබුණි. සැලසුම් කළ පරිදි රු. මිලියන 2 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රාදේශීයව සපයාගනු වෙනුවට රජයේ මුදල් වැයකර සපයා ගැනීමට සිදුවී තිබුණු අතර, ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි මහජන තරහයට ඉදිරිපත්කර නොතිබුණි. තවද, ඉදිකිරීමට අදාළ අත්‍යාවශ්‍ය ලේඛන නිසි ලෙස යාවත්කාලීනව ගොනුකර නොතිබුණි.	පලාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියක් මත ඉදිකිරීම් කටයුතු ආරම්භ කළයුතු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කළයුතු යුතුවීම.

(ආ)	ඉංජිනේරුවරයෙකුගේ උපදේශයන් සහ අධික්ෂණයකින් තොරව පැරණි අත්තිවාරමේ කොටසක් ප්‍රයෝජනයට ගැනීම හා ගොඩනැගිල්ලේ බර දරා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මහපෙන්වීම් ලබා නොගැනීම නිසා ඉදිකිරීම සිදුකරන අතරතුර අඩි 4 ක් උසට බැඳ තිබුණු ගඩොල් බිත්ති කිහිපයක්ම පුපුරා ගෙඩනැගිල්ලෙන් පිටතට ඇලවීමෙන් පසුව එම බිත්ති ඉවත්කර කොන්ක්‍රීට් ටයිබීම් ඉදිකර ඒ මත වෙරගැන්වූ කුලුණුද සමඟ බිත්ති නැවත ඉදිකිරීමට සිදුව තිබුණු අතර, මෙමඟින් විනාශ වූ අමුද්‍රව්‍ය හා ශ්‍රම හානිය ගණනයකර නොතිබුණි. තවද, ගොඩනැගිල්ලේ වැඩකටයුතු අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වීමටත් , සියයට සීයකින් පමණ ඉදිකිරීම් පිරිවැය ඉහළ යාමටත් මෙම තත්ත්වය හේතු වී තිබුණි.	ඉදිකිරීම් කටයුතු තාක්ෂණික හෝ ඉංජිනේරු නිර්දේශයන් හා මහපෙන්වීම් මත මෙහෙයවිය යුතුවීම.
(ඇ)	දොර,ජනෙල් සඳහා වියළි සහ පදම් කළ දැව භාවිතා නොකිරීමත්, නුපුහුණු ශ්‍රමිකයින් යොදවා තනා නිමකිරීමත් නිසා බොහෝ දොර ජනෙල් සුමටව වැසීමට නොහැකි වන ලෙස ඇදවී තිබුණු අතර, දොර ජනෙල් වැසීමෙන් පසුව විශාල හිඩැස් දක්නට ලැබුණි. ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කළ ලී පංතිය පිළිබඳව තාක්ෂණ වාර්තාවකින් තහවුරුවක්ද ලබාදී නොතිබුණු අතර, නාන කාමරවල සහ ස්ථාන කිහිපයක බිම් ගඩොල් ඇතිරීම සුමටව සිදු නොකිරීම නිසා ජලය කාන්දුවෙමින් පැවතුණි.	ඉදිකිරීම් කටයුතු තාක්ෂණික හෝ ඉංජිනේරු නිර්දේශයන් හා මහපෙන්වීම් මත මෙහෙයවියයුතු වීමත්, තාක්ෂණික නිර්දේශයන් මත ගොඩනැගිලි ද්‍රව්‍ය තෝරාගැනීම හා තනා නිමකිරීම කළයුතුවීම.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් ලැබීම්

කෘෂි සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා ඇතා ආදායම්වලින් දෙපාර්තමේන්තුව සැලකිය යුතු ආදායමක් රැස්කරන අතර, සමාලෝචිත වර්ෂයේදීද එම ආදායම් ප්‍රභවයන්ගෙන් එකතුව රු. මිලියන 1,565 ක ආදායමක් රැස්කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට සමාලෝචිත වර්ෂයේද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.1.2 හිඟ ආදායම්

දෙපාර්තමේන්තුව වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවලට සපයනු ලැබූ ආරක්ෂක හා වෙනත් සේවාවන් ඉටුකර දීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු නමුත් එකතුව රු.මිලියන 334 ක හිඟ ආදායම් 2023 මාර්තු මස 24 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පවරා ගැනීම් කටයුතු අවසන් නොකරන ලද බිම් කැබලි 299 තුල දෙපාර්තමේන්තුව විසින් ඉදිකරන ලද ගොඩනැගිලි 404 ක වර්ග අඩි 119,581 ක ගොඩනැගිලිවල වටිනාකම් තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ACA 6 ආකෘතිය තුළ දක්වා තිබූ වාහන තුළ එකම වාහන අංකයෙන් අවස්ථා 2 කදී වාහන වටිනාකම් ඇතුළත්කර තිබූ අවස්ථා 30 ක් නිරීක්ෂණය වූ අතර, ඒ අනුව ද්විගණනය වී තිබුණු වාහන වටිනාකම රු.මිලියන 53 ක් විය.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරනු ලබන වාහන 64 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් විකුණා තිබූ වාහන 20 ක් අතුරින් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත්කර තිබූ වාහන 6 ක් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට

කටයුතුකර නොතිබුණි. තවද, ඉතිරි වාහන 14 ට අදාළව දෙපාර්තමේන්තුවට ලැබීම් හා විකිණීම් යන ගණුදෙනු දෙකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2022 වර්ෂයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් දෙපාර්තමේන්තුවට ලද කාබනික පොහොර නිෂ්පාදනයට අදාළ යන්ත්‍ර 11 ක්, ලීටර් 5000 ජල ටැංකි 06 ක්, විවිධ කටයුතු සඳහා භාවිතා කරන තවත් යන්ත්‍ර 07 ක්, ඩිජිටල් තරාදියක් හා ග්‍රීස් පොම්පයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුලත්කර නොතිබුණි.

1.6.2.1.2 ලේඛනගත වී හෝ ගිණුම්ගත වී නොතිබුණු වත්කම්

දෙපාර්තමේන්තුව විසින් පවරා ගැනීම් අවසන් කරන ලද ඉඩම් කැබලි 31 ට අදාළ හෙක්ටයාර් 11.0716 ක ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම්තුල පිහිටි ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය අවසන්වන විටද තක්සේරුකර ලේඛනගතකර නොමැති අතර, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයටද ඇතුලත්කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මියගිය නිලධාරීන් 31 දෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 3.36 ක් වූ ණය අයකර ගෙන නොතිබුණු අතර, ඒ තුළ රු. මිලියන 2.1ක් වූ වසරකට වඩා පැරණි ණය ශේෂයන් විය.

(ආ) විශ්‍රාම ගිය නිලධාරීන් 34 දෙනෙකුගෙන් රු. මිලියන 2.48 ක ණය ශේෂ අයවීමට පැවති නමුත් වසරකට වඩා පැරණි රු. මිලියන 2.05 ක් වටිනා ණය ශේෂද එම ණය ශේෂ තුල පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද එම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) සේවය හැර ගිය නිලධාරීන් 195 ක ගෙන් රු. මිලියන 14.37 ක ණය ශේෂ පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ණය ශේෂ අතරින් වසර 04 කට වඩා පැරණි ණය ශේෂ රු.මිලියන 5.26 ක් හා වසර 03 කට වඩා පැරණි ණය ශේෂය රු.මිලියන 4.12 ක් වූ අතර, මෙම ණය ශේෂයන්ද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) නිලධාරීන් 200 දෙනෙකුගෙන් 2022 වර්ෂය ආරම්භ වන විට අයවිය යුතුව පැවති එකතුව රු.මිලියන 29.95 ක් වූ ණය ශේෂයන් 2022 වර්ෂය තුලදී එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතුකර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද එම ණය ශේෂ එලෙසම පැවතුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන තුළ හෙලිදරව් කර තිබූ රු. මිලියන 112.28 ක් වටිනා බැඳීම් හා බැරකම් 2023 වර්ෂයේ මාර්තු මස අවසන් වන විටද දෙපාර්තමේන්තුව විසින් පියවා නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
	xxviii පරිච්ඡේදයේ 1.3	දෙපාර්තමේන්තුවේ හට /භටවරියන් 2569 ක් දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරස්ථාන/පුරාවිද්‍යාස්ථාන ඇතුලු පූජනීය ස්ථාන වෙත විවිධ රාජකාරී කටයුතු සඳහා දීර්ඝ කාලයක සිට අනුයුක්ත කර ඇති අතර, එම භට /භටවරියන්ගේ පැමිණීම පිටවීම විධිමත් අධීක්ෂණයකින් තොරව 2022 වර්ෂයේදී වැටුප් ලෙස රු.මිලියන 1,294.78 ක මුදලක් ගෙවා තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්	

රෙගුලාසි සංග්‍රහය

මුදල් රෙගුලාසි 104(3) (4)	මිහින්තලය බලකා මූලස්ථානයට අයත් කැබ රථයකට 2021 දෙසැම්බර් 14 දින යාන්ත්‍රික වශයෙන් අලාභ හානියක් සිදු වී තිබුණි. එම අලාභහානිය අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 1. 06 ක මුදලක් වැයවන බවට තක්සේරුකර ඇති අතර, එම හානිය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් දින 07 ක් ඇතුලත නිකුත් කිරීමට කටයුතුකර නොතිබුණු අතර, 2023 මාර්තු 31 දිනවන විටත් පරිපූර්ණ වාර්තාද ඉදිරිපත්කර නොතිබුණි.
මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371(5)	කිසියම් විශේෂිත කාර්යයකට ලබා දුන් අතුරු අග්‍රිමයක් එම කාර්යය නිම කළ විගසම හෝ අදාළ කාර්යය නිමකර දින 10 ක් තුළ නැවත පියවිය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 37 කදී නිලධාරීන් 15 දෙනෙකුහට ලබාදී තිබුණු එකතුව රු.මිලියන 2.17 ක් වූ අත්තිකාරම් දින 12 ත් 207 ත් අතර, ප්‍රමාදයකින් යුක්තව පියවා තිබුණි. තවද, යම් නිලධාරියෙකු ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර නැවත අත්තිකාරම් මුදලක් නොගෙවිය යුතු නමුත් ඊට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් 6 දෙනෙකුට අවස්ථා 19 කදී රු.මිලියන 1.12 ක අත්තිකාරම් 2022 වර්ෂයේදී ලබාදී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය

දෙපාර්තමේන්තුවේ හටයින්ගේ නිලඇදුම් මසා නිම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන අනුරාධපුර රඹාව බලකායේ මැහුම් ව්‍යාපෘතිය, ඉදිකරමින් පවතින ඇහළුම් කර්මාන්තශාලා ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි 2016 අප්‍රේල් 03 දින සිට වර්ෂ 06 ක පමණ කාලයක් තිස්සේ පවත්වා ගෙන ගොස් තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) අවශ්‍ය අමුද්‍රව්‍ය නොලැබීම හේතුවෙන් 2022 පෙබරවාරි මාසයේ සිට විගණන දිනය වූ 2022 සැප්තැම්බර් 27 දින දක්වා මාස 08 ක පමණ කාලයක් තිස්සේ තාවකාලිකව වැඩ නවතා දමා තිබුණි.

(ආ) මෙම මැහුම් මධ්‍යස්ථානය තුළ ඒ සඳහා යොදාගන්නා යන්ත්‍රසූත්‍ර 54 ක්, වායු සම්කරණ යන්ත්‍ර 06 ක්, විදුලි පංකා 13 ක් ,අමු ද්‍රව්‍ය තොග ඒකක 164,202 ක් සහ අමතර කොටස් හා උපාංග ඒකක 1247 ක් මාස 08 ක පමණ කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. මේවා මෙසේ නිෂ්කාර්යව පැවතීමෙන් නැවත භාවිතා කිරීමේදී විවිධ කාර්මික ගැටළු ඇතිවීමට හැකි බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) මුදල්, යන්ත්‍රසූත්‍ර හා පුහුණු ශ්‍රමය ආයෝජනයකර තිබූ මෙම ව්‍යාපෘතියෙන් නිසි ප්‍රතිලාභ ලබාගැනීමේ ඉදිරි වැඩපිළිවෙලක් පිළිබඳව කළමනාකාරිත්වයේ විධිමත් සැලැස්මක් හා මඟපෙන්වීමක් ලබාදීමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතරමඟ නවතා දැමීමට සිදුව ඇති බව නිරීක්ෂණය කෙරේ.

3.2 ප්‍රසම්පාදනයන්

3.2.1 ප්‍රසම්පාදන සැලැස්ම

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 4.2.1 (ඇ) පරිදි ඊලඟට එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවද, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2022 වර්ෂය සඳහා එකතුව රු.මිලියන 854 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයක් දක්වා නොතිබුණි.

3.2.2 සමාලෝචිත වර්ෂයේ සිදුකළ ප්‍රසම්පාදනයන්

දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ සිදුකළ ප්‍රසම්පාදනයන් අතරින් විගණන නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

අ.අ	මිලදී ගත් ද්‍රව්‍ය	වටිනාකම (රු.මිලියන)	විගණන නිරීක්ෂණ
01.	කොන්ඩවිචිය කෘෂි ව්‍යාපෘතිය සඳහා Acetamiprid insecticide 540 kg ක් මිලදී ගැනීම පරීක්ෂාව - 2022	5.91	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ඡේදය පරිදි විෂය විශේෂඥයෙකුගෙන් සහ ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳව ප්‍රමාණවත් දැණුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන් තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත යුතු වුවත් මේ සඳහා සහභාගී කරගත් තාක්ෂණික ඇගයීම් කමිටුව මෙම අවශ්‍යතා සපුරා

			ඇති බව විගණනයේදී නහවුරු නොවුණි.
02.	ජල බෝතල් 60000 ක් මිලදී ගැනීම පරීක්ෂාව - 2022	1.07	(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ 5.4.10 ප්‍රකාරව කාර්ය සාධනය අසාර්ථකවන අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන අස්පීත්වය ආරක්ෂා කර ගැනීම සඳහා වටිනාකමින් සියයට 10 ක කාර්ය සාධන බැඳුම්කරයක් ඉදිරිපත් කරන ලෙස, තෝරාගත් සැපයුම්කරුට ලංසු පිරිනැමීමේදී දන්වා ඇතත්, අදාළ සැපයුම්කාර ආයතනය විසින් කාර්ය සාධන බැඳුම්කරය ඉදිරිපත් කිරීමකින් තොරව ගිවිසුම් අත්සන්කර මිලදී ගැනීම් සිදුකර තිබුණි. (ආ) තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වූ දිනය හා ප්‍රසම්පාදන කමිටුව රැස්වීම් වාර්තා දිනය සමාන වීම හා ප්‍රසම්පාදනය පිරිනැමීමේ දින, ගිවිසුම් ගත දින හා ඉන්වොයිස් පතේ සඳහන් දින තුනත් එකම දිනය වීම මගින් මෙම ප්‍රසම්පාදනයේ ස්වාධීනත්වය පිළිබඳව විගණනයට සැහිමට පත්විය නොහැකිවිය.
03.	ටයර්,ට්‍යුබ් සහ කොලර් මිලදී ගැනීම පරීක්ෂාව - 2022	6.36	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ප්‍රකාරව කාර්ය සාධනය අසාර්ථකවන අවස්ථාවන්හිදී ප්‍රසම්පාදන අස්පීත්වය ආරක්ෂාකර ගැනීම සඳහා වටිනාකමින් සියයට 10 ක කාර්ය සාධන බැඳුම්කරයක් ඉදිරිපත් කරන ලෙස තෝරාගත් සැපයුම්කරුට ලංසු පිරිනැමීමේදී දන්වා ඇතත්, අදාළ සැපයුම්කාර ආයතනයන් ගෙන් කාර්ය සාධන බැඳුම්කරය ලබා ගැනීමකින් තොරව ගිවිසුම් අත්සන්කර මිලදී ගැනීම් සිදුකර තිබුණි.
04.	පරිගණක සහ ලේසර් පොයින්ටර් 01 මිලදී ගැනීම පරීක්ෂාව - 2022	1.8	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 ප්‍රකාරව වටිනාකමින් සියයට 10 ක කාර්ය සාධන බැඳුම්කරයක් ලබා ගැනීමකින් තොරව ගිවිසුම් අත්සන්කර මිලදී ගැනීම් සිදුකර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 වර්ෂයේ ශ්‍රම පිරිවැය නොමැතිව රු. මිලියන 15.37 ක ඇස්තමේන්තු වියදමක් යටතේ අනුරාධපුර රඹුව බලකායේ 115'x38' ප්‍රමාණයේ දෙමහල් ඇඟළුම් කර්මාන්තශාලාවක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණු නමුත් විගණන දිනය වන 2022 සැප්තැම්බර් 27 දින වන විටත් අදාළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 555 කින් 2022 දෙසැම්බර් 31 දිනවන විටත් බිම් කැබලි 31 ට අදාළ හෙක්ටයාර් 11.0716 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් පවරා ගැනීමට කටයුතුකර තිබූ නමුත් ඉතිරි බිම් කැබලි 524 ක ප්‍රමාණය විගණිත දිනය වන 2023 මාර්තු 31 දින වන විටත් පවරා ගැනීම් කටයුතු අවසන්කර නොතිබුණි.

(ඇ) විවිධ අමාත්‍යාංශවලට හා දෙපාර්තමේන්තු වලට අයත් ඩිෆෙන්ඩර් රථයක්, ජීප් රථ 03 ක්, වෑන් රථයක්, ත්‍රී රෝද රථයක්, යතුරුපැදි 05 ක්, ට්‍රැක්ටර් 02 ක් හා ට්‍රැක්ටර් ට්ලෙර් 03ක් ලෙස වාහන 16 ක් දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් තිබෙන නමුත්, එම වාහන වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.4 නිශ්කාර්ය වත්කම්

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

කැබිතිගොල්ලෑව බලකායේ ක්‍රියාත්මක හරිතාගාර මිරිස් ව්‍යාපෘතිය සඳහා අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගැනීමකින් තොරව මිලදී ගෙන තිබූ විවිධ වර්ගයේ උපකරණ හා ද්‍රව්‍ය අයිතම 20 කට අදාළව රු. මිලියන 4.47 ක් වටිනා අයිතම් වර්ග 1,045 ක ප්‍රමාණයක් 2022 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා එනම් වර්ෂයකට ආසන්න කාලයක් අදාළ බලකායේ කිසිදු ප්‍රයෝජනයකින් තොරව නිශ්කාර්යව ගබඩාකර තිබුණි.

3.5 පාඩු හා හානි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 වර්ෂය හා 2021 යන වර්ෂවල පහත සඳහන් එකතුව රු.මිලියන 26.74 ක අලාභ හානි මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත්කර නොතිබුණි.

(ආ) 2021 වර්ෂයේ කුරගල බලකායේ සිදු වූ කෝන්ගල බිම්තැන්න තලනබටු වගාව විනාශ වීම හා 2020 වර්ෂයේ අක්කර 3.5 ගස්ලබු වගාව විනාශ වීම යන වගා හානි දෙකක් සම්බන්ධයෙන් 2023 මාර්තු 27 දින වන විටත් අලාභයන් තක්සේරුකර ලේඛනගතකර නොතිබුණි.

(ඇ) මු.රෙ.110 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ සිදුවූ හානි යාවත්කාලීනව හානි පිළිබඳ ලේඛනයක සටහන්කළ යුතු වුවත්, 2021 වර්ෂයට අදාළ රු. මිලියන 4.94 ක් වටිනා කෘෂි හානි දෙකක් 2023 මාර්තු 27 දින වන විටත් හානි පාඩු ලේඛනයේ ඇතුලත්කර නොතිබුණි.

(ඉ) මහඔය බලකාය යටතේ බක්කිඇල්ල අනුකලාපයේ 2010 හා 2012 වර්ෂයන්හි පවත්වාගෙන ගොස් තිබුණු ගඩොල් ව්‍යාපෘතීන්හි ඇති වී තිබුණු ගඩොල් 762,322 ක ඌණතාවයක් නිසා රු.මිලියන 5.45 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදුවී තිබුණි. 2023 අප්‍රෙල් 10 දින වන විටත් ඉන් රු.මිලියන 2.55 අය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු නමුත් රු.මිලියන 2.9 ක් වූ ඉතිරි මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සෙසු නිල හා භට/භටවරියන්ගේද පුරප්පාඩු 6,349 ක් පැවතුණි.

සෙසු නිල හා භට/භටවරියන්

විස්තරය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	23	18	05
තෘතීක මට්ටම	84	71	13
ද්විතීක මට්ටම	126	73	53
ප්‍රාථමික මට්ටම(ස්ථීර)	39,960	33,682	6,278
වෙනත්(අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්)	-	07	-
එකතුව	**40,193**	**33,851**	**6,349**

දෙපාර්තමේන්තුවේ 33,851 ක් වූ සමස්ථ කාර්ය මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂයේ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී තිබුණේ 1,330 දෙනෙකු පමණි.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අතිගරු ජනාධිපතිතුමන්ගේ "රට හඳන සෞභාග්‍යයේ පෙර දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉදිරි ව්‍යාපෘති හා සැලසුම් සකස් කර ක්‍රියාවට නැංවීම		√	
තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ප්‍රකාශිත ජාතික තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම		√	
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අලුතින් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අනුමත කර ගැනීම හා දැනට අනුමත කර ඇති උසස් කිරීමේ පරිපාටිය වර්තමාන අවශ්‍යතාව පරිදි සංශෝධනය කිරීම			√
දෙපාර්තමේන්තු පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම	√		
කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම හා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුව)	√		
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු කෘෂි, පශු හා විවිධ නිෂ්පාදන ව්‍යාපෘතීන්හි අපේක්ෂිත නිෂ්පාදන / අස්වනු ඉලක්ක සපුරා ගැනීම හා අපේක්ෂිත ආදායම මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම.		√	
විවිධ ඉදිකිරීම්, සිද්ධස්ථාන හා පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂක නඩත්තු, සංරක්ෂණ, නගර අලංකරණ ආදී වශයෙන් පැවරෙන ව්‍යාපෘතීන් නිසි පරිදි ඉටුකිරීම		√	

5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්කය / දර්ශකය	2022 භෞතික ප්‍රගතිය	2022 වර්ෂයේ ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
				0%-49%	50%-74%	75%-100%
1	2	3	4	5		
2.C **සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම**	1. විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදු කිරීම	i. වාර්ෂිකව වී, එළවළු, බඩඉරිඟු, කජු, දේශීය අඹ, විවිධ ධාන්‍ය, කුළු බඩු වගා කිරීම. කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන කිරීම	a.වගාකළ අක්කර ගණන/බෝග වශයෙන් වී - අක්කර 4,160 බඩඉරිඟු - අක්කර 721 කවුපි - අක්කර 36 කුරක්කන් - අක්කර 232 උඳු - අක්කර 270 තල - අක්කර 221 රටකජු - අක්කර 135 වෙනත් භෝග - අක්කර 3,198 b.ඵලදාව කිලෝ ගණන/බෝග වශයෙන් වී - කි.ග්‍රෑ 3,676,200 බඩඉරිඟු - කි.ග්‍රෑ 130,706 කජු - කි.ග්‍රෑ 57,793 කවුපි - කි.ග්‍රෑ 9,823 කුරක්කන් - කි.ග්‍රෑ 41,629 උඳු - කි.ග්‍රෑ 41,800 තල - කි.ග්‍රෑ 32,559 රටකජු - කි.ග්‍රෑ 147,236 වෙනත් භෝග - කි.ග්‍රෑ 3,529			✓

	3. දියර කිරි ජීවානුහරණය කිරීම හා දියර කිරි යොදා ගනිමින් අගය එකතු කළ නිෂ්පාදන හඳුන්වා දීම	iii. අවශ්‍යතාවයට ගැලපන පරිදි කිරි නිෂ්පාදන ඉහළ නැංවීම	දියර කිරි අස්වැන්න = ලීටර 11,361		✓	
3.5 **හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාර ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම**	7. මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වීම වැළැක්වීම	ii. වාර්ෂිකව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 541ක් දිවයින පුරා පිහිටා ඇති සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු බලකා විසින් පවත්වා ඇත.			✓
4.1. **2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන පරිදි සියලු ගැහැණු හා පිරිමි ළමයින් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපනයක් සම්පූර්ණකර සිටින බව තහවුරු කිරීම**	7. දිවයිනේ ගුරුවරුන් හිඟ ඉතා දුෂ්කර ප්‍රදේශයන්හි පාසල් 193 ක ගුරුවරුන් ලෙස දැනුම හා නිපුණතාව ඇති සිවිල් ආරක්ෂක නිලධාරීන් අනුයුක්ත කරවීම.	V. 2025 වන විට ගුරු හිඟතා ඇති දිවයිනේ සියළුම පාසල් වෙත අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාව මත නිසි පුහුණුව හා නිපුණැති ගුරුවරුන් අනුයුක්ත කරවීම සහ එමඟින් සෑම දරුවකුටම අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය තහවුරු කිරීම	මේ යටතේ පාසල් විශේෂයෙන්ම උතුරු, උතුරුමැද හා නැගෙනහිර පළාත් වල පාසල් 142ක් සඳහා ස්වේච්ඡා ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 184ක් අනුයුක්ත කර ඇත.		✓	
	8. සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය තුළ පෙර පාසල් දරුවන් සඳහා දිවා සුරැකුම් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම	Vi. 2025 වන විට සිවිල් ආරක්ෂක පෙර පාසල් ජාලය 750 දක්වා තවදුරටත් ව්‍යාප්ත කර තවත් දරුවන් 5000කට පමණ පෙර පාසල් හා මුල් ළමාවිය සංවර්ධන පහසුකම් ලබා දීම.	මේ යටතේ පෙරපාසල් හා මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 560ක් ක්‍රියාත්මක කර ඇත. ඒ මඟින් දරුවන් 13,428ක් වෙත අධ්‍යාපනය හා රැකවරණය ලබා දී ඇති අතර, ඒ සඳහා ගුරුවරු ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් 1,156ක් අනුයුක්ත කර ඇත.			✓

<table>
<tr><td></td><td>9.
සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයන්ගේ පාසල් යන වයසේ සෑම දරුවකුටම අවශ්‍ය අභ්‍යාසපොත් කට්ටලයක් බැගින් වාර්ෂිකව ලබා දීම</td><td>Viii.
2025 වන විට සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන්ගේ හා ආශ්‍රිත අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට අවශ්‍ය අභ්‍යාස පොත් ලබා දීම</td><td>සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයන්ගේ පාසල් යන දරුවන් 39,747 කට නව වසරට අවශ්‍ය පාසල් පොත් 309, 599ක් බෙදා දී ඇත.</td><td></td><td></td><td>✓</td></tr>
<tr><td>6 b.
ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගීත්වය, දිරිගැන්වීම සහ සහාය ලබා දීම</td><td>1.
දිවයින පුරා ගොඩ වූ වැව් නැවත සැකසීම සහ අපවිත්‍ර වූ වැව් පිරිසිදු කර පිළිසකර කිරීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කිරීම.</td><td>i.
ගොඩ වූ හා අපවිත්‍ර වූ වැව් මහජන පරිභෝජනයට සුදුසු වන පරිදි සහ කෘෂිකර්මාන්තයට යොදා ගත හැකි ලෙස පිළිසකර කිරීම.</td><td>2022 වර්ෂයේදී වැව් පිළිසකර කර නැත.
එසේ නමුත් වකුගඩු රෝගය බහුලව පැතිර යන ප්‍රදේශයන්හි පහත දක්වා ඇති ආයතන මඟින් ස්ථාපනය කර ඇති ජල පෙරණ යන්ත්‍ර 322ක් සඳහා සිවිල් ආරක්ෂක සාමාජිකයන් 480 දෙනෙකු යොදවා දිවා රාත්‍රී පිරිපහදු ජලය ලබා දීම සිදුකර ඇත.
<table>
<tr><th>ආයතනය</th><th>ශ්‍රී ලංකා නාවික හමුදා ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>ශ්‍රද්ධා රූපවාහිනියේ ජල පිරිපහදු මධ්‍යස්ථාන</th><th>වෙනත් ජල පිරිපහදු මධ්‍යස්ථාන</th></tr>
<tr><td>මධ්‍යස්ථාන සංඛ්‍යාව</td><td>243</td><td>68</td><td>11</td></tr>
<tr><td>හට සංඛ්‍යාව</td><td>320</td><td>142</td><td>18</td></tr>
</table></td><td></td><td>✓</td><td></td></tr>
</table>

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5.2.1 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

- මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය අනුව, එකී කාර්යන් කිනම් තිරසර සංවර්ධන ඉලක්කයන් හා සැසඳෙන්නේ ද යන වග හඳුනා ගැනීම.

- එම කාර්යන්, අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හා තවදුරටත් සෘජුව සහසම්බන්ධ කර ඊට තිරසර සංවර්ධන ඉලක්ක මුලික කර ගත් නව මුහුණුවරක් ලබා දීම.

- හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු අංශ වෙත ලබා දුන් උපදෙස් ප්‍රකාරව සැලසුම් සකස් කිරීම, එම සැලසුම් වාර්ෂිකව සැලසුම් වාර්තාවට ඇතුළත් කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කරවීම.

- ඉහත 5.1 ඡේදයෙහි හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු අතුරින් මෙම දෙපාර්තමේන්තුවේ සෘජු රාජකාරී වපසරිය තුළ නීතිය හා සාමය සුරැකීම, දිළිඳු බව පිටුදැකීම වැනි අරමුණු කිහිපයක් 75% ක පමණ ප්‍රතිශතයකින් ඉටු කිරීමට හැකි වීම.

5.2.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

- මෙම දෙපාර්තමේන්තුව විශාල ශ්‍රම බලකායකින් සමන්විත දෙපාර්තමේන්තුවකි. එම ශ්‍රම බලකායට විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සරිලන හා විධිමත් ලෙස පවරාගත හැකි ඉඩම් නොමැතිකම එක් අභියෝගයකි.

- එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරගෙන යාමේදී හදිසි සම්පත් ඌනතාවන් ඇති වීම සහ අනපේක්ෂිත ව්‍යවසනවලින් ඇති වන බලපෑම් තවත් එක් අභියෝගයකි.

- තිරසර සංවර්ධන ජාතික සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වීම සඳහා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර ප්‍රකාශනයන්හි සිට සියලුම ආයතනික පරිපාටින්, සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කළ යුතුව ඇති බැවින්, ඒ සඳහා අනුගතවීමට යම් කාලයක් වැය වීම.

- මෙම සංකල්පය මෑතක සිට හඳුන්වාදුන් නව වැඩපිළිවෙලක් බැවින් පුර්ව අත්දැකීම්, දැනුම සහ යටිතල පහසුකම් සපයා ගැනීමට හැකි වන සේ මෙම සංකල්පය සාර්ථකව ක්‍රියාත්මක වන ආයතනික පුර්වදර්ශයන්හි හිඟතාව.

- තිරසර සංවර්ධන ජාතික වැඩපිළිවෙල තුළ එක් එක් ආයතනය වෙත පැවරෙන ඉලක්ක කවරේද යන්න, එම ඉලක්ක අන්තර් සම්බන්ධීකරණයට හා ඉටු කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ජාතික මට්ටමින් පුළුල් සංවිධනාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක නොවීම මත එක් එක් ආයතන මෙම වැඩසටහන තුළ හුදකලා වීම.

6 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)*
ජ්‍යෙෂ්ඨ	23	19	04
ද්විතියික	84	71	13
තෘතියික	126	73	53
ප්‍රාථමික	39,960	34,176	5,784
එකතුව	40,193	34,339	5,854





6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

මෙම දෙපාර්තමේන්තුවට නව බඳවාගැනීම් සිදු නොකරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලැබී ඇත. ඒ අනුව දැනට මෙම දෙපාර්තමේන්තුව වර්ෂ 10 කට ආසන්න කාලයක් තිස්සේ නිලධාරීන් විශ්‍රාම යෑම, මියයෑම, ඉල්ලා අස්වීම්, සේවයෙන් පහකිරීම් යනාදී වශයෙන් කාර්ය මණ්ඩලයේ සිදු වන අඩු වීම් ප්‍රතිපූර්ණය නොවන ක්ෂය වන දෙපාර්තමේන්තුවක් බවට පත් කර ඇත.

ඒ අනුව තාක්ෂණික, සෞන්දර්ය, ක්‍රීඩා, පරිගණක, කාර්මික වැනි විෂයන් තුළ හටයන් කැපවීමෙන් හා දැඩි පුහුණුවෙන් අත්පත් කරගත් දෙපාර්තමේන්තු කීර්තිනාමය හා ප්‍රමිතිය අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යෑමට බාධාවන් මතු වී ඇත. විශ්‍රාම යාම, මියයෑම වැනි හේතූන් නිසා නිපුණැති නිලධාරීන්ගේ දැනුම අහිමි වීමත්, එම හිඟයට අලුතින් බඳවාගැනීම් සිදු කළ නොහැකි වීමත් ඊට හේතුවයි.

අවම වශයෙන් උක්ත දක්වා ඇති විෂයන් සඳහා සීමාවන්ට යටත්ව හෝ නවක නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට කර ඇති ඉල්ලීම් සඳහා අනුමැතිය ලැබෙන්නේ නම්, එකී කාර්යසාධන රික්තය සාධනීය ලෙස අවම කර ගත හැකි වනු ඇත.

දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය තුළ, උක්ත කි පුරප්පාඩු සම්පූර්ණ කිරීම ඉතා අත්‍යවශ්‍ය හා කඩිනම් අවධානය යොමුවිය යුතු කාරණාවක් බව වැඩිදුරටත් පෙන්වා දෙමු.



6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
දිස්ත්‍රික් නිලධාරි සඳහා බලකා පරිපාලනය පිළිබඳ පුහුණු පාඨමාලාව අදියර 1	28	දින 13	40	-	දේශීය	පුහුණුව හා හැකියාව වර්ධනය
මූලික පුහුණු පාඨමාලාව	61	මාස 01	-	-	එම	එම
දිස්ත්‍රික් නිලධාරි සඳහා බලකා පරිපාලනය පිළිබඳ පුහුණු පාඨමාලාව අදියර 2	27	දින 13	40	-	එම	එම
සිඟාදෙ සාමාජික / සාමාජිකාවන් සඳහා පරිපාලන වැඩමුළුව	56	දින 03	240	-	එම	එම
ලිපිකරු පාඨමාලාව	50	මාස 01	-	-	එම	එම
සිඟාදෙ සාමාජික / සාමාජිකාවන් සඳහා පරිපාලන වැඩමුළුව	62	දින 05	-	-	එම	එම
අත් යන්ත්‍ර හා ජේෂකර්ම වැඩමුළුව	34	දින 11	10	-	එම	එම
සෞන්දර්ය පුහුණුව	110	මාස 04	160	-	එම	එම
නර්තන පුහුණුව	70	මාස 03	120	-	එම	එම
වෙබ් අඩවි යාවත්කාලීන කිරීම	01	මාස 06	90	-	එම	එම
SKILL DEVELOPMENT FUND LTD ආයතනය මඟින් පවත්වනු ලබන රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැඩමුළුව	01	දින 02	7.5	-	එම	එම
ජ්‍යෙෂ්ඨ නියාමක නියාමකවරියන් සංස්කරණ පාඨමාලාව අදියර 1		දින 10	-	-	එම	එම
පදනම් ආයතනය මඟින් පවත්වනු ලබන ලිපිකරු පුහුණු පාඨමාලාව	40	දින 10	452	-	එම	එම
වෛද්‍ය සහායක හා ප්‍රථමාධාර පාඨමාලාව	70	දින 03	-	-	එම	එම
බියුගල් සංස්කරණ පාඨමාලාව	20	මාස 01	-	-	එම	එම
Government Payroll System පාඨමාලාව	04	දින 03	72	-	එම	එම
පොල් සංවර්ධන අධිකාරිය මඟින් පවත්වනු ලබන පොල් ආශ්‍රිත නිෂ්පාදන පුහුණු වැඩමුළුව	05	දින 03	-	-	එම	එම
ජ්‍යෙෂ්ඨ නියාමක නියාමකවරියන් සංස්කරණ පාඨමාලාව අදියර 2	177	දින 12	-	-	එම	එම

*** ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

- මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ වූයේ යුද සමයේ තර්ජිත ගම්මාන ආරක්ෂා කර ගනිමින් රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමයි. ඒ අනුව කාලින අවශ්‍යතාව මත අධ්‍යාපන, වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් ඇගයීමකින් තොරව අදාළ ප්‍රදේශයන්හි පදිංචි පුද්ගලයන් යන පදනමින් පමණක් ඔවුහු සේවයට බඳවා ගෙන ඇත. එසේ හෙයින් ඔවුන් අනෙකුත් සන්නද්ධ හමුදා හා පොලිස් සාමාජිකයන්ට සාපේක්ෂව වෘත්තීය හා තාක්ෂණික දැනුමින් අඩු ධාරිතාවක පිරිසක් විය. එසේ නමුත්, යුද විජයග්‍රහණයෙන් පසු විධිමත් විෂය නිර්දේශයක් හා කාල සටහනක් යටතේ දෙපාර්තමේන්තු පුහුණු පාසල් තුළින් ඔවුන් වෙත මූලික හා නායකත්ව පුහුණු ලබා දෙන ලදී. එමගින් ඔවුන් අනෙකුත් හමුදාවන්ට සමාන ආචාරශීලි, විනයගරුක හා වෘත්තීය හමුදාවක් බවට පරිවර්තනය කර ගැනීමට හැකි විය. තවද හමුදා සංග්‍රාම, සරඹ, තූර්ය වාදන, සෞන්දර්ය, තාක්ෂණ වැනි විෂයන්හි වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූලව ඔවුන්ට ලබාදෙනු ලබන පුහුණුව තුළින් හමුදාවක් ලෙස ඔවුන්ගේ ධාරිතා වර්ධනය අපේක්ෂා කෙරේ.

- දෙපාර්තමේන්තුවට අනුමත උසස් කිරීමේ පරිපාටිය අනුව, සේවයේ ස්ථීර වීමට හා ඉදිරි උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට මූලික හා නායකත්ව පුහුණු සපුරා තිබීම අනිවාර්ය වේ.

- බාහිර වෘත්තීය පුහුණු ආයතන වෙතින් විවිධ වෘත්තීය පුහුණු ලබා දීම තුළින් සිවිල් ආරක්ෂක සාමාජිකයන් සේවයෙන් විශ්‍රාම ලැබූ පසු වුව ද තම දැනුම හා පරිචය භාවිතයෙන් විවිධ කර්මාන්තයන්හි ස්වයං රැකියාවක නියැලීමෙන් අතිරේක අදායමක් ලැබිය හැකි වනු ඇත.

- ඊට අමතරව, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව මණ්ඩලය වැනි විවිධ බාහිර ආයතන වෙතින් හා සුදුසුකම් ඇති දෙපාර්තමේන්තු සම්පත් දායකයන් වෙතින් ඔවුන් වෙත ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සංග්‍රහය, ප්‍රසම්පාදන සංග්‍රහය, රජයේ ආයතනික ගිණුම්කරණය, වැටුප් සැකසීම, විගණනය, කාර්යාලයීය කාර්ය පරිපාටි, දෙවන භාෂා පාඨමාලා යනාදී වශයෙන් විවිධ පුහුණු ලබා දීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

7 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
1.6	වෙනත්	අනුකූල නොවේ	අදාළ නොවේ	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම.	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම.	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.	-	-
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ	දෙවන කාර්තුවේදී ඇතිවූ ඉන්ධන අර්බුධය හේතුවෙන් කමිටු 03 ක් පවත්වා ඇත.	2022 වර්ෂයේ පැවැත්වීමට නොහැකි වූ රැස්වීමේ න්‍යාය පත්‍රයේ කරුණු 2022 අවසාන විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලදී.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ	-	-
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	-	අනුකූල නොවේ	කල්බදු ගෙවනු ලබන වාහන මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැත.

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	නිරවුල් කරමින් පවති	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	වර්ෂය අවසාන විමට පෙර පියවා ඇත	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ	-	-
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.	-	-
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.	-	-

අවසානය.

කාර්යසාධන වාර්තාව - 2022		
අනුමැතිය		
මේජර් ජෙනරාල් එන්. ආර්. ලමාහේවගේ (විශ්‍රා)	අධ්‍යක්ෂ ජනරාල්	
සංස්කරණ හා ප්‍රතිශෝධන කමිටු සාමාජිකයින්		
ලුතිනන් කර්නල් ආර්.එම්.සි.එල්.කේ.කේ. රත්නායක	අධ්‍යක්ෂ (පුහුණු)	සභාපති
ලුතිනන් කර්නල් එල්.ආර්.එම්.යූ.බී. රත්නායක	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්)	සාමාජික
ලුතිනන් කර්නල් ඊ.ආර්.කේ. එදිරිමුණි	ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (ව්‍යාපෘති)	සාමාජික
ලුතිනන් කර්නල් ඒ.එස්. කුමාර	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන)	සාමාජික
වී.ආර් සම්පත් මහතා	සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති ගිණුම්)	සාමාජික
අධීක්ෂණය හා මෙහෙයවීම		
රියර් අද්මිරාල් ඩබ්.ඩී.ඊ්.එම්. සුදර්ශන (විශ්‍රා)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	
බ්‍රිගේඩියර් වී. වීරක්කොඩි (විශ්‍රා)	අධ්‍යක්ෂ (පාලන)	
ඩී. නර්මදා ජයනන්ද මිය	සහකාර අධ්‍යක්ෂ (පාලන)	
කෙටුම්පත්කරණය, සැකසුම හා පරිගණක යතුරු ලියනය		
බී.කේ.එච්. මෙන්ඩිස් මිය	කළමනාකරණ සේවා නිලධාරී	